ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

தேசிய விஞ்ஞான மற்றும் தொழில்நுட்ப ஆணைக்குழு

National Science and Technology Commission

NASTEC











වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

2019

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව 2019

ස්තුතිය

නස්ටෙක් ආයතනයෙහි ක්‍රියාකාරකම් සඳහා පුහුණුව හා මූලාශ්‍රාධාර ලබා දීම සම්බන්ධයෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට කළමනාකාරිත්වය සිය කෘතඥතාවය පළ කරයි. නස්ටෙක් ආයතනයෙහි ක්‍රියාකාරකම් සිදු කිරීම වෙනුවෙන් එහි කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දැක්වූ සහයෝගය කොමිෂන් සභාවේ සභාපතිනිය සහ සාමාජිකයින් අගය කරති.

නස්ටෙක් ආයතනය පිළිබඳව

ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වූ ඉහළම ආයතනය වශයෙන් නස්ටෙක් ආයතනය නම් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කෙරෙන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ.



ආයතන පරිශ්‍රයේ ලිපිනය

06 මහල, D කොටස, ii අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල

සම්බන්ධවීම් පිළිබඳ තොරතුරු



011- 2186711



011- 2186713



info@nastec.gov.lk



www.nastec.gov.lk



ලංකා බැංකුව, හයිඩ්පාර්ක්



ජාතික විගණන කාර්යාලය

පටුන

ස්තුතිය 2

නාස්ටෙක් ආයතනය පිළිබඳව 3

රූපසටහන් වගුව 5

මෙහෙවර 6

මෙහෙවර 6

සංවිධාන පැතිකඩ 8

සංවිධාන ව්‍යුහය 9

භාණ්ඩාගාර නියෝජිතයින් 16

නාස්ටෙක් කාර්යමණ්ඩලය - 2019 17

විද්‍යා හා තාක්ෂණ වැඩසටහන් සමාලෝචනය - 2019 18

රජය සඳහා ජාතික විද්‍යා උපදේශන පද්ධතියක් ස්ථාපිත කිරීම 27

තරුණ විද්‍යාඥ සංසදය (YSF) 27

තරුණ විද්‍යාඥ සංසදයේ 8 වන සම්මන්ත්‍රණය - 2019 27

තරුණ විද්‍යාඥ සංසදයේ (YSF) මෙහෙයුම් කමිටුව 29

2019 වර්ෂය සඳහා වන YSF මෙහෙයුම් කමිටුව 29

අනෙකුත් ක්‍රියාකාරකම් 31

ජාත්‍යන්තර සබඳතා 32

මානව සම්පත් කළමනාකරණය 35

කාර්ය මණ්ඩල පුවත් 36

ධාරිතා වර්ධනය සහ ඵලදායිතා සංවර්ධනය 38

බාහිර පුහුණු වැඩසටහන් 39

උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැකසීම 40

අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 40

සුබසාධන කාර්යයන් 40

විදේශ පුහුණු / වැඩමුළු / සම්මන්ත්‍රණ / සංසද සඳහා සහභාගී වීම 41

රූපසටහන් වගුව

රූපසටහන් 1: පණත හා නෛතිකභාවය, දැක්ම හා මෙහෙවර 6

රූපසටහන 2: සංවිධාන ව්‍යුහය 9

රූපසටහන 3: 2019 STEPI - NASTEC STI ප්‍රතිපත්ති වැඩමුළුව 19

රූපසටහන 4: මැණික් හා ස්වර්ණාභරණ පුහුණු ආයතනයේ ජාතික සමාලෝචනය වාර්තාව 22

රූපසටහන 5: මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ කාර්යසාධන සමාලෝචනය (GJRTI) 22

රූපසටහන 6: ගොවි කටයුතු පර්යේෂණ මධ්‍යස්ථානයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව 23

රූපසටහන 7: කොළඹ දී බීජ සංගමයේ ප්‍රධාන සාමාජිකයින් සමඟ පැවැත්වූ රැස්වීම 24

රූපසටහන 8: ගන්නොරුව SCPPS දී පැවැත්වූ ගොවි සංවිධාන නායකයින් සමඟ බීජ පනත පිළිබඳ වැඩමුළුව 24

රූපසටහන 9: ශාක ආරක්ෂණ සේවා පාර්ශ්වකරුවන්ගේ රැස්වීම 25

රූපසටහන 10: බණ්ඩාරනියක ආයුර්වේද අනුස්මරණ පර්යේෂණ ආයතනයේ ආයතනික සමාලෝචනය (BMARI) 26

රූපසටහන 11:STI විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සමාලෝචන අත්පොත යාවත්කාලීන කිරීම 27

රූපසටහන 12: 8 වන YSF සංසදය 2019 28

රූපසටහන 13: රාජගිරිය බැංකු අධ්‍යයන පරිශ්‍රයේදී පැවැත්වූ දෙවන උපාධිඅපේක්ෂකයින්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය. 2019 30

රූපසටහන 14: ක්ෂේත්‍ර 12 අදාල ශිල්පසේනා ප්‍රදර්ශණය 31

රූපසටහන 15: BMICH හි පැවැත්වූ ශිල්පසේනා ප්‍රදර්ශණය 32

රූපසටහන 16: නස්ටෙක් ආයතනය සෙත්සිරිපාය නව කාර්යාල පරිශ්‍රයට ගෙන යාම 36

රූපසටහන 17: 2019 අගෝස්තු මාසයේ විද්‍යා පර්යේෂණය සඳහා ජාතික පර්යේෂණ සභාවේ ජනාධිපති සම්මානය 37

රූපසටහන 18: NERD ආයතනයේ පැවැත්වූ බාහිර පුහුණු වැඩසටහන 39

රූපසටහන 19: STEPI- නස්ටෙක් STI ප්‍රතිපත්ති වැඩමුළුව 2019 42

රූපසටහන 20: ඵලදායී විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන සංවර්ධන පුහුණු වැඩමුළුව 42

රූපසටහන 21: නැගෙනහිර ආසියාවේ STI ධාරිතා වර්ධන වැඩමුළුව - විද්‍යා උපදෙස් 42

අප ගැන

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් ස්ථාපිත කරන ලද අතර 1998 අගෝස්තු මාසයේදී එය ක්‍රියාත්මක වීම ඇරඹිණි . 1998 දෙසැම්බර් 06 දින නිල වශයෙන් ආරම්භ කරන ලද කොමිෂන් සභාව 1999 ජනවාරි මස පූර්ණ ක්‍රියාකාරී ආයතනයක් බවට පත්වූයේය.

දැක්ම

දැක්ම

"ශ්‍රී ලාංකීය ජනතාවගේ සමෘද්ධිය හා සෞභාග්‍යය ඉහළ නැංවීම උදෙසා විද්‍යාවේ හා තාක්ෂණයේ විභවය හා භාවිතය පිළිබඳ රජයට උපදෙස් සපයන විශිෂ්ට ආයතනයක් වීම"

මෙහෙවර

මෙහෙවර

"තිරසාර සංවර්ධනය සඳහා යොදාගැනීම උදෙසා විද්‍යා හා තාක්ෂණ ජාතික හැකියාවන් ගොඩ නැංවීම සඳහා රජයට ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම් ඉදිරිපත් කිරීම"

රූපසටහන් 1: පණිවිඩය හා පෞනිකභාවය, දැක්ම හා මෙහෙවර

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කර ඇති කාර්යයන් (1994 අංක 11)

- පහත කාර්යන්ට අදාලව ප්‍රතිපත්ති හා සැලසුම් ඇතුලත් විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති හා සලසුම් පිළිබඳව රජයට උපදෙස් දීම:-

  - ආර්ථික වර්ධනය වඩාත් සක්‍රීය කිරීම සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම;
  - කර්මාන්ත, කෘෂිකර්මය, සේවා සහ ආර්ථිකය සම්බන්ධයෙන් තරඟකාරිත්වය පිළිබඳ විද්‍යාව හා තාක්ෂණයේ බලපෑම;
  - ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් සෞඛ්‍ය, පෝෂණය සහ දිළිඳුකම පිටු දැකීම පිළිබඳ විද්‍යාව හා තාක්ෂණයේ බලපෑම
  - අධ්‍යාපනය,පුහුණු හා පර්යේෂණය සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගනිමින් විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය වන මානය හා වෙනත් සම්පත් සංවර්ධනය;
  - විද්‍යාව හා තාක්ෂණ ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය;
  - ජාතික වැදගත්කමක් විය යුතු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛත්වයක් ලබා දීම;
  - විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විශේෂඥයින් ගොඩනැගීම, රඳවා ගැනීම සහ ආකර්ශණය කිරීම සඳහා යෝග්‍ය වන කාලගුණික තත්වයක් ඇති කිරීම;
  - විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ඵලදායි යොදා ගැනීම් කෙරෙහි උපකාරී වන කළමනාකරණ උපාය මාර්ග ස්ථාපිත කිරීම;
  - විද්‍යාව හා තාක්ෂණ ආයතනයන්හී පර්යේෂණ හා සංවර්ධනයට මූල්‍යයනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම ඇතුලත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන් කිරීම;

- ශ්‍රී ලංකාවේ ඉකුත් වර්ෂයේ විද්‍යා තාක්ෂණ ක්‍රියාකාරකම් සමාලෝචනය කර මානව සම්පත් සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳ ඵලදායිතාවය, විද්‍යාව හා තාක්ෂණ ආයතනයනහි කාර්යසාධනය, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව රාජ්‍ය මුදල් භාවිතයේ ඵලදායිතාවය, රාජ්‍ය අංශ සහ පුද්ගලික අංශ ආයතනය විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ වාර්තවක් වාර්ෂිකව රජයට ඉදිරිපත් කිරීම;

- දෙවන වගන්තියේ නිශ්චය කරන ලද පරමාර්ථයන්ට අදාලව විද්‍යාව හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම;

- ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් දීමට පෙර අදාල විද්‍යාව හා තාක්ෂණ ආයතන විමසා බැලීම;

- දෙවන වගන්තියේ නිශ්චය කරන ලද පරමාර්ථයන්ට අදාලව අමාත්‍යාතුමාගේ පූර්ව අනුමැතිය සහිතව විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව ශ්‍රී ලංකා ද්වී වාර්ෂික සම්මන්ත්‍රණය කැඳවීම, ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පොදු වේදිකාවක් ලබා දීම සහ එම සාකච්ඡාව පිළිබඳ වාර්තාවක් අමාත්‍යාතුමාට ඉදිරිපත් කිරීම.

- සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වේ.
- අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ.
- ප්‍රතිපත්ති සැලසුම් හා අනෙකුත් විද්‍යා හා තාක්ෂණ සම්බන්ධ ලේඛණ සකස් කරන අධ්‍යයන කණ්ඩායම් හා උපදේශක සංසද සඳහා පහසුකම් සැලසීම සහ කලමනාකරණය කිරීම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් හා විද්‍යාඥයින් විසින් සිදු කෙරේ.
- නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලනය පිළිබඳ සියළුම කටයුතු නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ඉටු කරනු ලබයි.

සංවිධාන ව්‍යුහය



රූපසටහන 2: සංවිධාන ව්‍යුහය

සභාපතිනියගේ සමාලෝචනය



2020 ජනවාරි 16 වන දින මම නස්ටෙක් හි සභාපති ධුරයට පත්වුවද, සභාපතිනිය වශයෙන්, 2019 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි.

පොදුවේ ගත් කල, රටක සංවර්ධනය එහි විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය සමඟ දැඩි ලෙස සම්බන්ධ වේ. එබැවින් බොහෝ රටවල්වල කෘෂිකාර්මික, සෞඛ්‍ය හෝ පුරවැසියන්ගේ දෛනික ජීවිතයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා විද්‍යා ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. කොවිඩ් -19 සමඟ ඇති වී තිබෙන වර්තමාන වසංගත තත්ත්වය විද්‍යාඥයින් ඔවුන් ක්ෂුද්‍රජීව, වෛරස්, වසංගත රෝග හෝ ගණිතඥ ක්ෂේත්‍රයේ විද්‍යාඥයින් වේවා ඔවුන්ගේ වැදගත්කම ඉතා පැහැදිලිව පෙන්නුම් කර දී ඇත.

1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (1994 විද්‍යා හා තාක්ෂණ පනත) මගින් පවරා ඇති බලතලවලට අනුකූලව, විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් දීමටත්, පසුගිය වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කර ඒ පිළිබඳව වාර්ෂික වාර්තාවක් රජයට ඉදිරිපත් කිරීමටත්, විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීමත්, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා සමුළුව ද්විවාර්ෂිකව කැඳවීමටත් නස්ටෙක් ආයතනයට බලය ඇත. තවද ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා විසින් පවරන ලද වෙනත් අදාළ කටයුතු සිදු කිරීමටත් නස්ටෙක් ආයතනය බැඳී සිටී.

මෙයට අනුව, 2019 වර්ෂය තුළදී, වාර්ෂික ජාතික විද්‍යා හා තාක්ෂණ වාර්තාව පිළියෙළ කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ආයතන 38 කින් නස්ටෙක් තොරතුරු රැස් කරගෙන ඇත. 2019 වර්ෂයේදී, 2016 සහ 2017 වර්ෂයන්ට අදාල ජාතික විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තා ප්‍රකාශ කිරීමට නස්ටෙක් ආයතනයට හැකි විය. සොයාගැනීම්වලින් හෙළිදරව්වූයේ අලෙවිකිරීමට හැකි නිෂ්පාදන හා තාක්ෂණ නිෂ්පාදනයන්ගේ අවශ්‍යතාවයේ වැඩිවීම, පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව වැඩි කිරීම, ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ සහරාවල පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම සහ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම යනාදියේ අවශ්‍යතාවයයි.

කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමඟ ඒකාබද්ධව නිල සංවර්ධන ආධාර (ODA) ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මක් ලෙස, නස්ටෙක් විසින් ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පද්ධතීන් තක්සේරු කිරීමට අදාළව ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන

නවෝත්පාදනයේ ප්‍රධාන පාර්ශවකරුවන් සහ කොරියාවේ ප්‍රතිපත්ති විශේෂඥයින් සමඟ එක්වී ඵලදායී සංසද දෙකක් පවත්වා ඇත.

එසේම, බලතලවලට අනුකූලව, 2019 වර්ෂයේදී, ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, කඩුවෙල මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය, මහඉලුප්පල්ලම ගොවිපල යාන්ත්‍රිකරණ පර්යේෂණ මධ්‍යස්ථානය සහ ගන්නොරුව, බීජ සහතික කිරීමේ සේවා මධ්‍යස්ථාන යන ආයතනවල කාර්ය සාධන සමාලෝචන පැවැත්වීමෙන් ආයතනික සමාලෝචන වාර්තා 04 ක් නස්ටෙක් ආයතනයට ලැබී ඇත. තවද, පැලෑටි සංරක්ෂණ සේවා සහ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ කාර්ය සාධන සමාලෝචනය ආරම්භ කරන ලද අතර එය 2020 දී අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ගුණාත්මකභාවය, පිරිවැය-ඵලදායීතාවය තක්සේරු කිරීමේ අරමුණින් අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත සමාලෝචන මණ්ඩල මගින් මෙම සමාලෝචන පවත්වන ලද අතර මෙම ආයතනවල සිදු කරන ලද පර්යේෂණ වල ප්‍රතිඵල, ජාතියේ අවශ්‍යතා සපුරාලීම සහතික කිරීමට ඉවහල් විය.

නොබැඳි හා අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ (NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය) ශ්‍රී ලංකාවේ ජාතික කේන්ද්‍රස්ථානය වන නස්ටෙක් ආයතනය, NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලංකා විද්‍යාඥයින්ට සහ විද්‍යා පරිපාලකයින්ට පුහුණු අවස්ථා කිහිපයක් ලබා දීමට සම්බන්ධ විය.

තරුණ විද්‍යාඥයින්ට සිය පර්යේෂණ සොයාගැනීම් ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රජාවට ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම උදෙසා, නස්ටෙක් ආයතනය විසින් 8 වන තරුණ විද්‍යාඥ සම්මන්ත්‍රණය සහ දෙවන ජාතික උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය යන පර්යේෂණ සම්මන්ත්‍රණ දෙකක් පවත්වන ලදී.

කොමිෂන් සභාවේ දෛනික කටයුතු වලට අමතරව, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ශිල්ප සේනා - ප්‍රදර්ශනය 2019 සඳහා නස්ටෙක් ආයතනය දායකත්වය ලබා දී තිබූ අතර, උපාංග වල අන්තර්ජාල (IoT) සහ 5G ලෙස හඳුන්වන තාක්ෂණික තේමාව (Tech Theme) සම්බන්ධීකරණය කිරීමටද දායක වී තිබුණි.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ගරු. අමාත්‍යතුමා, ලේකම්තුමා සහ අනෙකුත් නිලධාරීන් ලබා දුන් ඵලදායි සහයෝගය සඳහා කෘතඥතාවය පුදමි. 2019 වර්ෂයේ සභාපතිනියටද, කොමිෂන් සභාවේ සාමාජිකයින්ටද, වැඩබලන අධ්‍යක්ෂකවරයාට සහ නස්ටෙක්හි කාර්ය මණ්ඩලයටද ඔවුන් විසින් 2019 වර්ෂය පුරාම දැක්වූ සහයෝගීතාව සහ සහාය සඳහා මා අවංකව ස්තූතිය පළකරමි.

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනි
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

කොමිෂන් සභාවේ සාමාජිකයන්



මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු , සභාපතිනි
(2019 මාර්තු 05 සිට 2019 ජූනි දක්වා)

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු 1982 දී MBBS සුදුසුකම් ලත් වෛද්‍යවරියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. ඇය 1985 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියක ලෙස සිය අධ්‍යයන කටයුතු ආරම්භ කළාය. ඇය 1989-1993 දක්වා වසර 5 ක් එක්සත් රාජධානියේ ලන්ඩන්හි ශාන්ත ජෝර්ජස් වෛද්‍ය විද්‍යාලයේ වෛරස් විද්‍යාව පිළිබඳ පර්යේෂණ සාමාජිකාවක් සහ රෙජිස්ට්‍රාර්වරියක් / ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරියක් ලෙස සේවය කරන කාළය තුලදී පශ්චාත් උපාධිය සම්පූර්ණ කළාය.

ඇය ජාත්‍යන්තර හා ද්විපාර්ශ්වික රැස්වීම් 30 කට අධික සංඛ්‍යාවක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති අතර යුනෙස්කෝ විද්‍යා කොමිෂන් සභා, ICGEB පාලක මණ්ඩලයේ රැස්වීම් සහ සාර්ක් විද්‍යා හා තාක්ෂණ රැස්වීම් සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට නායකත්වය දී තිබේ.



මහාචාර්ය නිරංජනි රත්නායක , සභාපතිනි
(2019 ජූලි 09 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

ඉංජිනේරු මහාචාර්ය (නිරංජනි රත්නායක මහත්මිය) මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියකි. ඇය 2017/2018 සැසියේදී ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේ (IESL) සභාපතිනිය වූ අතර මේ වන විට IESL සභාවේ හිටපු සභාපති ලෙස සේවය කරයි. ඇයගේ විශේෂඥ ක්ෂේත්‍රය වන්නේ පාරිසරික ඉංජිනේරු විද්‍යාව වන අතර ව්‍යාපෘති මට්ටමින් මෙන්ම උපායමාර්ගික මට්ටමින් පාරිසරික ඇගයීම් සිදුකිරීමේ අත්දැකීම් ඇය සතුය. ඇය දැනට ශ්‍රී ලංකාවේ පාරිසරික වෘත්තිකයින්ගේ ආයතනයේ සභාපතිවරිය ලෙස කටයුතු කරයි.



මහාචාර්ය ටියුලි දයානන්ද ද සිල්වා
(2019 මාර්තු 05 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

ප්‍රවීන මහාචාර්ය ටියුලි ද සිල්වා දැනට වයඹ විශ්ව විද්‍යාලයේ කුලපති ලෙස කටයුතු කරයි. ඔහු ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා සහ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ සභාපතිවරයා වූ අතර ආයුර්වේද ඖෂධ ප්‍රමිතිකරණය හා නවීන මාත්‍රා ආකෘතීන් සකස් කිරීම පිළිබඳ පර්යේෂණ ආරම්භ කළේය. ඔහු එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ (වියානා) ඔස්ට්‍රියාවේ රසායනික කර්මාන්ත ශාඛාවේ විශේෂ තාක්ෂණික උපදේශක ලෙස එක්සත් ජාතීන්ගේ සේවයෙන් විශ්‍රාම ගියේය. ඔහු ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ ප්‍රථම ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරයා වන අතර එහිදී ආයුර්වේද පර්යේෂණ හා ගුණාත්මක ආයුර්වේද නිෂ්පාදන සංවර්ධනය කිරීම ආරම්භ කළේය.
අධ්‍යාපනය, පර්යේෂණ සහ සංවර්ධනය හා කර්මාන්තය සඳහා ඔහු දැක්වූ දායකත්වය උදෙසා ලෙස ශ්‍රී ලංකා අතිගරු ජනාධිපති විසින් දේශබන්දු ජාතික ගෞරව සම්මානයෙන් පිදුම් ලද අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ඩී.එස්.සී (හොනොරියස් කෝසා) සම්මානයෙන් පිදුම් ලද්දේය. ඔහු විද්‍යාවේ දියුණුව සඳහා වූ ශ්‍රී ලංකා සංගමයේ මහ සභාපති ලෙසත්, ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ සභාපති ලෙසත් සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමියේ, ලංකාවේ රසායන විද්‍යා ආයතනයේ සහ එක්සත් රාජධානියේ රාජකීය රසායන විද්‍යා සංගමයේ (FRSC) සමාජිකයෙකි.



මහාචාර්ය හේවා වඩුගේ සිරිල්
(2019 මාර්තු 05 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

මහාචාර්ය හේවා වඩුගේ සිරිල් 1978 දී සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස සිය අධ්‍යයන කටයුතු ආරම්භ කළ අතර වර්තමානයේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කෘෂිකාර්ම පීඨයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ඔහු පර්යේෂණ සහ, කෘෂිකාර්මික සමිතිය, විවිධ මණ්ඩල සහ ප්‍රසිද්ධ සමාගම්වල වගකිවයුතු තනතුරු රාශියක් දරා ඇති අතර තාක්ෂණික හා අධ්‍යයන විශේෂඥ උපදෙස් ලබා දී ඇත. ඔහු 2002 සිට වසර දෙකක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කොමසාරිස් ජනරාල්වරයා ලෙස ද කටයුතු කර ඇත. 2015 සිට 2020 දක්වා කාලය තුළ දෙවරක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ඔහු රටේ පශු සම්පත් සංවර්ධනයට වටිනා දායකත්වයක් ලබා දුන්නේය.



ආචාර්ය ජනක රත්නසිරි
(2019 මාර්තු 05 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

ආචාර්ය ජනක රත්නසිරි, ඔහියෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලයෙන් ලැබූ ඉංජිනේරු ඊඑල් හි ආචාර්ය උපාධිය සහිත ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙකු වන අතර ඉලිනොයිස් විශ්ව විද්‍යාලයේ පිරිනැමූ ඊඑල් ඉංජිනේරු ආචාර්යවරයෙකි. ඔහු 1963 සිට 1993 දක්වා ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයෙහි, ආරම්භයේදී ව්‍යවහාරික භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රෝනික අංශයේ පර්යේෂණ නිලධාරියෙකු ලෙසත් පසුව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙසත් සේවය කරන ලදී. පසුව ඔහු 1993 සිට 2000 දක්වා ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම හා දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුව පිළිබඳව වූ සම්මුතිය සම්බන්ධීකරණය කිරීමෙන් පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන තාක්ෂණික උපදේශක ලෙස සේවය කළ අතර ඔහු ශ්‍රී ලංකාවේ ස්වාභාවික ගෑස් භාවිතය පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම සහ ස්වාභාවික ගෑස් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා බනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ උපදේශකවරයෙකු ලෙස සේවය කරන ලදී. හරිතාගාර වායු විමෝචන හා සින්ක් පිළිබඳ ජාතික ඉන්වෙන්ටරි සකස් කිරීමේදී ඔහු පරිසර අමාත්‍යාංශයේ උපදේශකයෙකු ලෙස සේවය කළේය. ඔහු විද්‍යාවේ දියුණුව සඳහා වූ ශ්‍රී ලංකා සංගමයේ (2002) හිටපු සාමාන්‍යාධිකාරීවරයෙකු වන. ශ්‍රී ලංකාවේ (1982) භෞතික විද්‍යා ආයතනයේ හිටපු සභාපතිවරයෙකි.

-



ආචාර්ය ඕරෙලියා ජෙනිෆර් පෙරේරා
(2019 මාර්තු 05 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

ආචාර්ය පෙරේරා 1986 දී වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලද අතර 2001 වර්ෂයේදී ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියක් බවට පත්විය. මේ වන විට කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති සහ ප්‍රධාන මහාචාර්ය ධුරය හෙබවයි. ඇය ඩන්ඩී විශ්ව විද්‍යාලයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ පිළිවෙලින් වෛද්‍ය අධ්‍යාපනය සහ කාන්තා අධ්‍යයනය පිළිබඳ පී.ජී. ඩිප්ලෝමාවක් සම්පූර්ණ කරන ලදී. ඇය වේල්ස් විශ්ව විද්‍යාලයෙන් MBA උපාධියක් ද සම්පූර්ණ කර ඇත.

පර්යේෂණ පැවැත්වීම තුළින් ක්ෂුද්‍රජීව විද්‍යාව හා සම්බන්ධ විද්‍යාවන් සඳහා ඇය දැක්වූ දායකත්වය විශිෂ්ටය. බෝවන රෝග හඳුනා ගැනීම සඳහා අණුකජීව විද්‍යාව භාවිතා කිරීමට ඇය පුරෝගාමී වූ අතර විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ක්ෂය රෝගය සඳහා අණුක ක්‍රම උපයෝගී කරගනිමින් ක්ෂය රෝගය වේගයෙන් හඳුනා ගැනීම සහ එම ක්ෂය රෝගයේ ඖෂධ ප්‍රතිරෝධය පිළිබඳ ක්ෂේත්‍රයට දායක වූවාය. ආචාර්ය පෙරේරා වසර 10 කට වැඩි කාලයක් එන්එස්එෆ් පර්යේෂණ සම්මාන සහ ජනාධිපති සම්මාන දිනා ගත් අතර බොහෝ පර්යේෂණ සංසදවල සම්පත්දායකයෙකු ලෙස දායකත්වය දරා ඇත. තවද, ඇය දේශීය හා විදේශීය විද්‍යාත්මක සැසිවල හොඳම වාචික හා පෝස්ටර් ඉදිරිපත් කිරීම් සඳහා සම්මාන රාශියක් දිනා ගෙන ඇත.



ඊ. එම්. ප්‍රසාද් එදිරිසිංහ මහතා
(2019 මාර්තු 05 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

ජ්‍යෙෂ්ඨ මූල්‍යකරුවෙකි. බැංකු නොවන මූල්‍ය ආයතනයක හිටපු ප්‍රධාන විධායක නිලධාරියෙකු / සාමාන්‍යාධිකාරීවරයකු වේ. බැංකු නොවන මූල්‍ය කර්මාන්තයේ වසර 35 ක පළපුරුද්දක් ඔහු සතුවේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පුවත්පත් සඳහා නිදහස් පර්යේෂණ මාධ්‍යවේදියෙකි. එක්සත් රාජධානියේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකාවේ කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා විද්‍යා දියුණුව පිළිබඳ සංගමයේ යාවජීව සාමාජිකයෙකි.



නිමල් රණමුබාරච්චි මහතා
(2019 මාර්තු 05 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

නිමල් රණමුබාරච්චි පෞද්ගලික නීතිඥයෙකි. 1979 දී නීතිඥයෙකු ලෙස සිය දීර්ඝ වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු 1982 ජූලි දක්වා එම වෘතියේ නිරත වී සිටි අතර ඉන්පසුව එක්සත් රාජධානියට ගොස් සොලිසිටර්වරයෙකු විය. ඔහු එක්සත් රාජධානියේ සොලිසිටර් සමාගම් කිහිපයක සොලිසිටර් ලෙස සේවය කළේය. 1986 දී ඔහු නැවත ශ්‍රී ලංකාවට පැමිණ සිවිල් හා අපරාධ නඩු විභාග සඳහා පෞද්ගලික පුහුණුවීම් වැඩි වශයෙන් දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකරණවල සිදු කළේය. ඔහු ලංකා බැංකුව, මහජන බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතනවල නීතිඥයෙකි.

භාණ්ඩාගාර නියෝජිතයින්

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මහතා (2017 මාර්තු 14 සිට 2019 ජූනි 13 දක්වා)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන
මුදල් අමාත්‍යාංශය

එස්.එච්.ඩී. කළුතන්ත්‍රි මෙය. (2019 ජූනි 13 සිට 2019 අගෝස්තු 20 දක්වා)

අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

මහාචාර්ය කපිල සේනානායක (2019 අගෝස්තු 20 සිට 2019 නොවැම්බර් 28 දක්වා)

අධ්‍යක්ෂ
රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

නස්ටෙක් කාර්යමණ්ඩලය - 2019

මහාචාර්ය නිරංජනි රත්නායක	සභාපතිනිය
ඩී. නන්දනී සමරවික්‍රම මිය	වැඩබලන අධ්‍යක්ෂක
ආචාර්ය කල්ප ඩබ්. සමරකෝන්	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ
සෙයිද් ෂහමී මයා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ
ජී.සී. කුමාරි පීරිස් මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් හා පාලන
රසිකා පෙරේරා මිය	විද්‍යාඥ
එම්.ඩී. තිලිනි මෙනෙවිය	විද්‍යාඥ
යූ.කේ.ඩී.අයි.එච්.කේ. උඩුගම මෙනෙවිය	පරිපාලන නිලධාරී
එස්.ඒ.ඩී.එස්.පී. සේනානායක මයා	තොරතුරු සන්නිවේදන තාක්ෂණ /දත්ත ගබඩා සහායක
ආර්.එම්.ටී. රත්නායක මයා	වැඩසටහන් සහකාර - මුදල්
ජී.එම්.සී.එන්. මහරගේ මිය	කළමනාකරණ සහකාර
ඩබ්.එම්.අයි.කේ. වෙදමුල්ල මිය	කළමනාකරණ සහකාර
අනිල් හෙට්ටිආරච්චි මයා	රියදුරු
ජයශාන්ත ප්‍රබාත් මයා	රියදුරු
ප්‍රදීප් එරන්ද මයා	රියදුරු
ඒ.ඩී. ධනපාල මයා	කාර්යාල කාර්යය සහයක
කනිෂ්ක ගිම්හාන් මයා	කාර්යාල කාර්යය සහයක

නස්ටෙක් හි කාර්යය (1): විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් දීම

ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) ප්‍රතිපත්තිය:

විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් දීම නස්ටෙක් හී අනිවාර්ය කාර්යයකි. ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය 2008 දී නස්ටෙක් විසින් සකස් කරන ලදී. 2017 දී පවත්වන ලද 182 වන කොමිෂන් සභා රැස්වීමේදී ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට හා යාවත්කාලීන කිරීමට නස්ටෙක් කොමිසම් සභාව තීරණය කළ අතර කොමිසම් සභාවේ එකඟතාවයෙන් පත් කරන ලද එක් එක් අනු කමිටුවල යෙදවුම් වලට අනුකූලව විද්‍යාඥයින් විසින් කෙටුම්පත ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ කාර්යය භාර ගන්නා ලදී. කෙටුම්පත් කරන ලද විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන (STI) ප්‍රතිපත්තිය වලංගු කරන ලද ජාතික ප්‍රතිපත්ති ආකෘතියට ඇතුළත් කර ඇති අතර මේ වන විට එය ජාතික STI ප්‍රතිපත්තිය ලෙස කෙටුම්පත් කර ඇත.

දකුණු කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) / ශ්‍රී ලංකාවේ ජාතික STI පද්ධතිය ඇගයීම් පිළිබඳ නස්ටෙක් සහයෝගීතා ව්‍යාපෘතිය 2018-2020

නස්ටෙක් විසින් 2018 දී ද. කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමඟ සහයෝගිත්වයෙන් නිල සංවර්ධන ආධාර (ODA) ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. සමස්ත ව්‍යාපෘතියේ විෂය පථය වූයේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) ප්‍රතිපත්ති මෙවලම ශක්තිමත් කර ජාතික ආර්ථික වර්ධනයට දායක වීමෙන් ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික හුවමාරුව වේගවත් කිරීම හා යහපත් ජාතික පර්යේෂණ හා සංවර්ධන වාණිජකරණය සහ නවෝත්පාදන හැකියාව කළමනාකරණය කිරීමෙන් එය ශක්තිමත් කිරීමය.

2018 මැද භාගයේදී STEPI-IICC කොරියාව සමඟ එක්ව නස්ටෙක් ආයතනය විසින් සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකාවේ STI ප්‍රතිපත්ති සම්පාදනය හා පර්යේෂණ හා සංවර්ධන වාණිජකරණය හැකියා වර්ධන' පිළිබඳ සාර්ථක වැඩමුළුවකින් පසුව, දෙවන වැඩමුළුව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ යටතේ පවතින විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රධානීන් සහ STEPI හි නියෝජිතයින්, ආචාර්ය ච් උං සෝන්ග් (ගෝලීය නවෝත්පාදන උපාය මාර්ග අංශයේ ප්‍රධාන අධ්‍යක්ෂ), ආචාර්ය වැන්ග් ඩොං කිම් (STI ODA ව්‍යාපෘති කාර්යාලයෙහි ප්‍රධානී), ආචාර්ය ඉන්කියුන්ග් සන් (සහකාර පර්යේෂණ සහායක) සහ බියුන් වූ ජියොන් මහතා (පර්යේෂක, STEPI) යන අයගේ සහභාගිත්වයෙන් 2019 මාර්තු 25 දින සිට 29 දින දක්වා කොළඹදී පැවැත්විණි.
නස්ටෙක් හි ඉල්ලීම පරිදි, 2019 ජුනි 24 සිට 29 දක්වා දකුණු කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ STI ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රතිපත්ති සහ ආයතනික රාමුව වැඩිදියුණු කිරීම සඳහා සහාය දැක්වීම පිළිබඳ විශේෂඥ රැස්වීමක් හා සම්මන්ත්‍රණයක් පවත්වන ලෙස STEPI ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමට ආරාධනා කර තිබුනි.







රූපසටහන 3: 2019 STEPI - NASTEC STI ප්‍රතිපත්ති වැඩමුළුව

ශ්‍රී ලංකාවේ ජාතික STI ප්‍රතිපත්ති පද්ධතිය ඇගයීම සම්බන්ධයෙන් සහයෝගිතා ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ 3 වන රැස්වීම සහ සාකච්ඡාව ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අංශයේ පාර්ශවකරුවන් 40 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් 2019 නොවැම්බර් 19 සිට 21 දක්වා බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

මේ අවස්ථාව සඳහා කොරියාවේ විද්‍යා හා තාක්ෂණ උසස් ආයතනයේ (KAIST) විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති උපාධිදාරී පාසලේ ප්‍රධානී මහාචාර්ය සෝ යං කිම්, හරිත තාක්ෂණ හවුල්කාරිත්ව මූල පිරීමේ (GTPI) ආතනයේ අධ්‍යක්ෂ සහ කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ආතනයේ (KAIST) හරිත තාක්ෂණ මධ්‍යස්ථානයේ (GCT) ජ්‍යෙෂ්ඨ පර්යේෂක ආචාර්ය ක්වාන්යොං කිම්, STEPI හි ව්‍යාපෘති කළමනාකරු සහ නිත්‍ය පර්යේෂණ සහකාර ආචාර්ය ඉන්කියුන්ග් සන් සහ කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ඇගයීම් හා සැලසුම් ආයතනයේ (KISTEP) නිත්‍ය පර්යේෂණ සහකාර හෙන්ග්මි කිම් මහත්මිය යන අය කොරියාවේ නියෝජිතයන් ලෙස සහභාගී වූහ.

නස්ටෙක් හි කාර්යය (2) : ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් වාර්ෂිකව වාර්තාවක් රජයට ඉදිරිපත් කිරීම

ඉකුත් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් වාර්ෂිකව වාර්තාවක් රජයට ඉදිරිපත් කිරීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC) බැඳි ඇත. මෙම වාර්තාවට මානව සම්පත් සංවර්ධනය සඳහා වන ක්‍රියාමාර්ගවල ඵලදායීතාවය ඇගයීම, විද්‍යා හා තාක්ෂණ ආයතනවල කාර්යසාධනය, විද්‍යාව හා තාක්ෂණය සඳහා වන රාජ්‍ය වියදම්වල ඵලදායීතාවය සහ රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම යන කරුණු ඇතුළත් වේ.

<u>විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2018</u>

මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා, නස්ටෙක් විසින් 2018 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ විද්‍යා හා තාක්ෂණ ආයතන 38 ක තත්ත්වය සමාලෝචනය කරන ලදී. මේ සම්බන්ධව ප්‍රුළුල් ක්ෂේත්‍ර පහක දත්ත එක්රැස් කරන ලදී. එම ක්ෂේත්‍රයන් වූයේ: i). මානව සම්පත්, ii). භෞතික සම්පත්, iii). පර්යේෂණ යෙදවුම්, iv). පර්යේෂණ නිමැවුම් v). මේ ක්‍රියාවලියේදී විද්‍යා හා තාක්ෂණ ආයතන විසින් සපයනු ලැබූ සේවාවන් පිළිබඳ තොරතුරු සමීක්ෂණ ප්‍රශ්නාවලියක් මගින් ලබා ගන්නා ලදී.

පහත සඳහන් කටයුතු නිම කරන ලදී:

- ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස් කිරීම
- දත්ත පද්ධතීන්ට දත්ත ඇතුළත් කිරීම
- දත්ත විශ්ලේෂණය

වාර්තා ලිවීම, සෝදුපත් කියවීම සහ ප්‍රකාශනය 2020 වන විට නිම කිරීමට නියමිතය. 2019 දී ජාතික 2016 සහ 2017 වර්ෂ වලට අදාල ජාතික විද්‍යා හා තාක්ෂණ තත්ව වාර්තාව ප්‍රකාශනයට පත් කිරීමට නස්ටෙක් ආයතනයට හැකි විය.





නස්ටෙක් හි කාර්යය (3) : විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම

පනතේ 2 වන වගන්තියේ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය කිරීමේ කාර්යය නස්ටෙක් ආයතනයට පැවරී ඇත.

ජාතික ප්‍රමුඛතාවයන් සහ අපේක්ෂාවන් ඉටු කරන බවට තහවුරු කිරීම සඳහා මෙම ආයතන විසින් සිදු කරනු ලබන විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය, පිරිවැය- ඵලදායීතාවය, අදාළත්වය සහ බලපෑම පිළිබඳ ඇගයීමේ අරමුණ සහිතව නස්ටෙක් විසින් පත් කරන ලද අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සමන්විතව බාහිර කමිටුවක් මගින් සමාලෝචනයන් සිදු කරනු ලැබේ.

සමාලෝචන ක්‍රියාවලිය සුවිශේෂී අදියර 4 කින් සමන්විත වේ.

- සමාලෝචනය සඳහා සූදානම් වීම
- සමාලෝචන කමිටුව ආයතනයට සංචාරය කිරීම
- සමාලෝචන කමිටුව විසින් කෙටුම්පත් වාර්තාව සකස් කිරීම
- සමාලෝචන කමිටුව විසින් අවසාන සමාලෝචන වාර්තාව සකස් කර නස්ටෙක් වෙත ඉදිරිපත් කිරීම

2019 දී පහත සමාලෝචිත වාර්තා අදාළ සමාලෝචන කමිටුවලින් නස්ටෙක් වෙත ලැබී තිබුණි.

- උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය, කඩුවෙල
- ගොවි කටයුතු පර්යේෂණ මධ්‍යස්ථානය, මහඉලුප්පල්ලම
- බීජ සහතික කිරීමේ සේවා ආයතනය, ගන්නොරුව

ආයතනික සමාලෝචන සම්බන්ධව සිදුකරන ලද ක්‍රියාකාරකම්

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය (GJRTI)

නස්ටෙක් ආයතනය විසින් 2018 සිව්වන කාර්තුවේදී මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සමාලෝචනය ආරම්භ කර 2019 දී එහි ක්‍රියාකාරකම් නිම කරන ලදී. පහත සඳහන් කමිටු සාමාජිකයින් විසින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය කරන ලදී.

- ආචාර්ය එන්.පී. විජයනන්ද (සභාපති)
- මහාචාර්ය පී.ජී.ආර්. ධර්මරත්න
- මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජීත්
- මහාචාර්ය සිරිමෙවන් කොළඹගේ
- හර්ෂ පත්බෙරිය මහතා

2019 පෙබරවාරි 15 වන දින කඩුවෙල මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ ප්‍රධාන කාර්යාලයට පළමු වරට සමාලෝචන කමිටුව සංචාරය කරන ලදී. මෙම කමිටුව මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ සභාපති, අධ්‍යක්ෂක ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවූ අතර ආයතනයේ ඇති පුහුණු හා රසායනාගාර පහසුකම් ද පරීක්ෂා කරන ලදී. මැණික් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වී ඇති, සේවා සපයන්නන්, පර්යේෂකයින්, අභ්‍යාසලාභීන් සහ රජයේ ආයතන කිහිපයක නියෝජිතයන් 32 කගේ සහභාගීත්වයෙන් මැණික් හා ස්වර්ණාභරණ

පර්යේෂණ හා පුහුණු ආයතනයෙහි බාහිර පාර්ශවකරුවන් සමඟ 2019 මාර්තු 8 වන දින බත්තරමුල්ල ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේදී රැස්වීමක් පවත්වන ලදී. කමිටුව 2019 අප්‍රේල් 11 වන දින රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයට ගොස් එහි පහසුකම් නිරීක්ෂණය කළ අතර වෙළඳ හා කර්මාන්ත නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීය. 2019 මැයි 3 වන දින සමාලෝචන මණ්ඩලය මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත දෙවන වරටත් ගොස් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡාවක් පැවැත්වීය. අවසාන සමාලෝචන වාර්තාව 2019 ඔක්තෝම්බර් මාසයේදී නස්ටෙක් ආයතනයට ලැබුණි.



රූපසටහන 4: මැණික් හා ස්වර්ණාභරණ පුහුණු ආයතනයේ ජාතික සමාලෝචනය වාර්තාව



රූපසටහන 5: මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ කාර්යසාධන සමාලෝචනය (GJRTI)

ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය (FMRC)

ගොවි කටයුතු පර්යේෂණ මධ්‍යස්ථානය යනු නිෂ්පාදන පිරිවැය අඩු කිරීම, ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල ප්‍රමාණය වැඩි කිරීම සඳහා ගොවිපල යන්ත්‍රකරණ තාක්ෂණය ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඵලදායී කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරන ආයතනයකි. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟත්වය ලබා ගැනීමෙන් පසුව නස්ටෙක් FMRC සමාලෝචනය ආරම්භ කරන ලදී. නස්ටෙක් ආයතනය විසින් 2019 මැයි මාසයේදී FMRC සමාලෝචනය ආරම්භ කරන ලද අතර පහත සඳහන් කමිටු සාමාජිකයින් මෙම සමාලෝචනයට සහභාගී වූහ.

- මහාචාර්ය එන්.ආර්. අර්ථනායක (සභාපති)
- ආචාර්ය සුසන්ත සිරිවර්ධන
- ඉංජිනේරු කේ.වයි.එච්.ඩී. ශාන්ත
- ඉංජිනේරු ටී.එම්.ආර්. දිසානායක

කමිටුව 2019 ජුනි මස 3 සහ 04 යන දිනවල මහඉලුප්පල්ලම FMRC වෙත සමාලෝචන චාරිකාවක නිරත වූ අතර ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡාවක් පවත්වා එහි ඇති පරීක්ෂණ පහසුකම් නිරීක්ෂණය කරන ලදී. 2019 ජූලි 05 වන දින කොළඹ හෙක්ටර් කොඩ්බෙකඩු ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනයේදී බාහිර පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පාර්ශ්වකරුවන් 86 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. අවසාන සමාලෝචන වාර්තාව කමිටුව විසින් 2019 ඔක්තෝම්බර් මාසයේදී කමිටුව නස්ටෙක් ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී.



රූපසටහන 6: ගොවි කටයුතු පර්යේෂණ මධ්‍යස්ථානයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

බීජ සහතික කිරීමේ සේවා මධ්‍යස්ථානය (SCS)

SCS සමාලෝචනය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඇතිව 2019 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදී. SCS සමාලෝචනය සිදු කරන ලද කමිටුවේ සාමාජිකයින් වූයේ;

- ආචාර්ය සරත් වීරසේන (සභාපති)
- ඩබ්ලිව්.ඒ.ජී. සිසිර කුමාර මහතා
- ආචාර්ය එල්. නුගාලියද්ද
- ඒ. ජයවර්ධන මහතා

කමිටුව 2019 මැයි සිට ජූලි දක්වා කාලය තුළ ආයතනයට සහ අනෙකුත් ප්‍රධාන කෘෂිකාර්මික ආයතනවලට කිහිප වතාවක්ම සංචාරය කරන ලදී. මෙම කාලය තුළදී සීතාඑලිය සහ දඹුල්ල



රූපසටහන 7: කොළඹ දී බීජ සංගමයේ ප්‍රධාන සාමාජිකයින් සමඟ පැවැත්වූ රැස්වීම

උපපොළවල් සඳහා ක්ෂේත්‍ර චාරිකා ද කමිටුව විසින් සිදු කරන ලදී. සමාලෝචන කමිටුව බීජ සහතික කිරීම, SPM සංවර්ධනය හා පෞද්ගලික අංශයේ SPM නිෂ්පාදනය, ආනයනය හා අලෙවිකරණය හා දේශීය බීජ නිෂ්පාදනය හා අලෙවිකරණයෙහි යෙදී සිටින ගොවි සංවිධාන සමඟද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟද සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. බීජ අපනයනකරුවන් හා බීජ හා රෝපණ සංගමය සමඟ රැස්වීමක් 2019 ජූලි 04 වන දින සිදු කරන ලද අතර බීජ පනත පිළිබඳ තවත් රැස්වීමක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ 2019 අගෝස්තු 09 වන දින පවත්වන ලදී. 2019 දෙසැම්බර් මාසයේදී කමිටුව විසින් අවසාන සමාලෝචන වාර්තාව නස්ටෙක් ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී.



රූපසටහන 8: ගන්නොරුව SCPPS දී පැවැත්වූ ගොවි සංවිධාන නායකයින් සමඟ බීජ පනත පිළිබඳ වැඩමුළුව

<u>පැළෑටි සංරක්ෂණ සේවය (PPS)</u>

පහත සඳහන් සාමාජිකයින්ගේ දායකත්වයෙන් PPS සමාලෝචනය 2019 ඔක්තෝබර් 7 වන දින ආරම්භ කරන ලදී.

- ආචාර්ය එස්. වීරසේන (සභාපති)
- මහාචාර්ය බී. මාරම්බේ
- ආචාර්ය පී.එම්. පී. සී. ජී.බණ්ඩාරනායක
- ජේ. ඒ.ටී.පී ගුණවර්ධන මහතා

කමිටුව PPS ආයතනයට කිහිප වතාවක්ම පැමිණ අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.



රූපසටහන 9: ශාක ආරක්ෂණ සේවා පාර්ශ්වකරුවන්ගේ රැස්වීම

බාහිර පාර්ශවකරුවන්ගේ සමාලෝචන රැස්වීම 2019 නොවැම්බර් 20 වන දින ගන්නොරුව හි සේවා පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. මෙම ක්‍රියාකාරකම 2020 දී නිම කිරීමට නියමිතය.

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය (BMARI)

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය (BMARI) යනු රජයේ ආයුර්වේද පර්යේෂණ ආයතනවලට පුරෝගාමී ආයතනයකි. මෙම ආයතනය බහුවිධ පර්යේෂණ සංකීර්ණය, පර්යේෂණ රෝහල, නවීන උපකරණ වලින් සමන්විත රසායනාගාර සංකීර්ණය සහ අක්කර 18 ක් පුරා පැතිර ඇති ඖෂධ පැළෑටි වලින් යුත් උද්‍යානයකින් සමන්විත වන්නේය. 1961 ආයුර්වේද පනතට අනුකූලව 1962 දී BMARI ස්ථාපිත කරන ලදී. මෙම ආයතනයේ විෂය පථය වනුයේ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර සම්බන්ධ පර්යේෂණ කටයුතු සිදු කිරීමයි. නස්ටෙක් විසින් 2019 නොවැම්බර් 22 වන දින BMARI සමාලෝචනය පහත සාමාජිකයින්ගෙන් යුත් කමිටුවක් මඟින් ආරම්භ කරන ලදී. 2020 මැද භාගය වන විට වාර්තාව නිම කිරීමට අපේක්ෂා කෙරේ.

- මහාචාර්ය ඩී.බී. මහින්ද වික්‍රමරත්න (සභාපති)
- ආචාර්ය පී.කේ. පෙරේරා
- ආචාර්ය. එස්.ආර්.එස්. එන්. සුදසිංහ
- ආචාර්ය පී. රණසිංහ
- ආචාර්ය තිලිනා වණිගසේකර



රූපසටහන 10: බණ්ඩාරනියක ආයුර්වේද අනුස්මරණ පර්යේෂණ ආයතනයේ ආයතනික සමාලෝචනය (BMARI)

ආයතන සමාලෝචන අත්පොත යාවත්කාලීන කිරීමේ වැඩමුළුව

2006 දී පවත්වන ලද BICOST IV හි නිර්දේශ මත පදනම්ව 2008 දී සකස් කරන ලද සමාලෝචන අත්පොතෙහි දක්වා ඇති මාර්ගෝපදේශ හා ක්‍රියා පටිපාටි භාවිතා කරමින් නස්ටෙක් ආයතනය විසින් ආයතන සමාලෝචනයන් පවත්වනු ලැබේ. දැනට පවතින අත්පොත මීට වසර 10 කට පමණ පෙර සකස් කර ඇති බැවින්, දිවයිනේ වර්තමාන STI පද්ධතිය සලකා බැලීමෙන් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය වැදගත් විය. මේ අනුව, STI පිළිබඳ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සමාලෝචන අත්පොත යාවත්කාලීන කිරීම සඳහා යෝජනා ලබා ගැනීම පිණිස පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුවක් 2019 ඔක්තෝබර් 29 වන දින රාජගිරියේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයේදී සංවිධානය කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ටී.එස්. විජේසේකර විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී. අත්පොතහි හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර පිළිබඳ කණ්ඩායම් සැසි පැවැත්වීමෙන් පසු වැඩමුළුව සාර්ථකව අවසන් කරන ලදී.





රූපසටහන 11: STI විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සමාලෝචන අත්පොත යාවත්කාලීන කිරීම

නස්ටෙක් කාර්යය (4): රජයට විද්‍යා හා තාක්ෂණ ආයතන පිළිබඳ ප්‍රතිපත්තීන් හා සැළසුම් සම්බන්ධයෙන් උපදෙස් දීමට පෙර එම අදාළ ආයතන විමසිම.

රජය සඳහා ජාතික විද්‍යා උපදේශන පද්ධතියක් ස්ථාපිත කිරීම

1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 5 වන වගන්තියේ සඳහන් විශේෂ ක්ෂේත්‍ර පිළිබඳව විද්‍යා උපදෙස් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් නියම කරන ලද ඉහළම ආයතනය නස්ටෙක් ආයතනය වේ. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන විෂය පථයන්හි සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රජයට ක්‍රියාකාරී ලෙස උපදෙස් දිය යුතු බවත්, ශ්‍රී ලංකා රජය විසින් දැනුවත් කර තීරණ ගැනීම සඳහා සහාය වන තීරණාත්මක ජාතික අවශ්‍යතා ප්‍රවණතා නිරන්තරයෙන් සන්නිවේදනය කළ යුතු බවත් හඳුනාගෙන තිබේ. මෙය 2019 දී ආරම්භ කරන ලද අතර නස්ටෙක් ක්‍රියාකාරී කමිටු රැස්වීම්වලදී සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදී.

තරුණ විද්‍යාඥ සංසදය (YSF)

ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥ සංසදය (YSF) සඳහා සත්කාරකත්වය දරනු ලබන්නේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම් සභාව (NASTEC) විසිනි. ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයින්ට විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම පිණිස 2000 වසරේදී නස්ටෙක් හි YSF ස්ථාපිත කරන ලදී. දැනට විවිධ ක්ෂේත්‍රයන්හී නිරත වී සිටින තරුණ විද්‍යාඥයින් 400 ඉක්මවූ සාමාජිකත්වයකින් YSF සමන්විත වේ.
වර්තමානයේ YSF ක්‍රියාකාරකම් පවතින්නේ නස්ටෙක්හී ක්‍රියාකාරී සැලැස්මෙහි ඇති විද්‍යා තාෂණ හා නවෝත්පාදන පිළිබඳව රජයට උපදෙස් දීම සඳහා පද්ධතියක් ස්ථාපිත කිරීම යන වැඩසටහන යටතේය.

තරුණ විද්‍යාඥ සංසදයේ 8 වන සම්මන්ත්‍රණය - 2019

2012 දී ආරම්භ කරන ලද YSF සම්මන්ත්‍රණය සංසදයක් ලෙස තරුණ විද්‍යාඥයින්ට සිය පර්යේෂණ කටයුතු විද්‍යාත්මක ප්‍රජාව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ජනප්‍රිය වැඩසටහනක් බවට පත්ව ඇත. අටවන YSF සම්මන්ත්‍රණය 2019 ජනවාරි 30 වන දින කොළඹ 07, ඉදිකිරිමි කර්මාන්ත සංවර්ධන අධිකාරියේදී (CIDA), තරුණ හා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් 80 ට වැඩි පිරිසකගේ

සහභාගීත්වයෙන් පවත්වන ලදී. නිබන්ධන සඳහා වූ කැඳවීමට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්, නස්ටෙක් ආයතනයට YSF සාමාජිකයින්ගෙන් විස්තරාත්මක නිබන්ධන 60 ක් ලැබී තිබුණි. YSF වෙත සිදු කරනු ලබන ගෞරවාන්විත සේවයක් ලෙස සෑම නිබන්ධනයක්ම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් ඇගයීමට ලක් කරන ලදී. ඔවුන්ගේ නිර්දේශ මත පදනම්ව, වාචික ඉදිරිපත් කිරීම් සඳහා නිබන්ධන 42 ක් තෝරා ගන්නා ලදී. මෙම කෙටි ලැයිස්තුගත නිබන්ධනයක් සම්මේලනයේදී ග්‍රන්ථයක් ලෙස ප්‍රසිද්ධ කරන ලදී. සම්මන්ත්‍රණයේදී තරුණ විද්‍යාඥයන් තිස් අට දෙනෙකු ඔවුන්ගේ නිබන්ධන ඉදිරිපත් කළහ.

පහත සඳහන් තේමාවන් හතක් යටතේ වාචික ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී;

- ආහාර විද්‍යාව හා පෝෂණය
- කෘෂිකාර්මික විද්‍යා හා ජීව විද්‍යාව
- පරිසර විද්‍යාව
- ඉංජිනේරු සහ පරිගණක විද්‍යාව
- ජෛව රසායනය හා රසායන විද්‍යාව
- ආර්ථික විද්‍යාව, සංඛ්‍යාලේඛන, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා
- අණුක ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යාව



රූපසටහන 12: 8 වන YSF සංසදය 2019

<u>තරුණ විද්‍යාඥ සංසදයේ (YSF) මෙහෙයුම් කමිටුව</u>

YSF සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවකින් (SC) සමන්විත වේ. මෙහෙයුම් කමිටුව මෙහෙයවනු ලබන්නේ සම-ලේකම්වරුන් දෙදෙනෙකු ඇතුලත්ව සභාපතිවරයෙකු විසිනි. සාමාන්‍යයෙන් YSF සම්මන්ත්‍රණයට සමගාමීව පවත්වන වාර්ෂික මහා සභා රැස්වීමේදී සෑම වසරකම නව මෙහෙයුම් කමිටුව තෝරා පත් කර ගනු ලැබේ.

<u>2019 වර්ෂය සඳහා වන YSF මෙහෙයුම් කමිටුව</u>

මෙහෙයුම් කමිටු රැස්වීම් මසකට වරක් නස්ටෙක් ආයතන පරිශ්‍රයේ පවත්වනු ලබන අතර ඉදිරි වර්ෂය සඳහා YSF ක්‍රියාකාරකම් සැලසුම් කර එම වර්ෂය සඳහා තේරී පත් වූ නව මෙහෙයුම් කමිටුව සමඟ පළමු රැස්වීමේදී සාකච්ඡා කරනු ලැබේ.

සභාපති	**ආචාර්ය ලසන්ත වීරසිංහ**	**කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය**
සම ලේකම්	ආචාර්ය උපනිත් ලියනාරච්චි	තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
සම ලේකම්	ආචාර්ය කසුන් මීගහකුඹුර	පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල
කමිටු සාමාජික	ආචාර්ය ඌෂා හෙට්ටිආරච්චි	වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ආචාර්ය දිනේෂ් ආටිගල	ඉංජිනේරු පීඨය, මොරටුව විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	මහාචාර්ය රංගික හල්වතුර	ඉංජිනේරු පීඨය, මොරටුව විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ආචාර්ය සමන්ත දිසානායක	කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ආචාර්ය කන්දයියා පකීරදන්	කෘෂිකර්මපීඨය, යාපනය විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ආචාර්ය සමීර සමරකෝන්	ජෛව රසායනය විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ආචාර්ය නිරෝෂිමා විතානගේ	වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ආචාර්ය ජානක විජේසිංහ	සත්ව විද්‍යාව හා අපනයන කෘෂිකර්ම පීඨය, ශ්‍රී ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
කමිටු සාමාජික	ඊ.එම්.එස්. ඉසංකා මෙය	කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ 07
කමිටු සාමාජික	එන්.වයි. ජයනාත් මහතා	කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය
නස්ටෙක් සම්බන්ධීකාරක	තිලිනි මූනගමගේ මෙය	ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

2 වන ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (NURS) - 2019

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින්, ආර්ථික විද්‍යාඥයින්, තාක්ෂණවේදීන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් නස්ටෙක් ආයතනය විසින් ප්‍රධාන කේන්ද්‍රගත ක්ෂේත්‍රයන් 10 ක් ඇතුළත්ව ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව (NRDF) සකස් කරන ලදී. NRDF හි යෝජනා කර ඇති පරිදි පර්යේෂණ හා සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මඟින් ආර්ථිකයට, පරිසරයට හා සමාජයට එකසේ ප්‍රතිලාභ ලැබෙන තිරසාර සංවර්ධනය කරා වේගයෙන් ඉදිරියට යාමට රටට සහාය විය හැකිය. එබැවින් අපේ රටේ විද්‍යාඥයින් අතර NRDF ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නස්ටෙක් විසින් ක්‍රියාකාරකම් කිහිපයක් ආරම්භ කරන ලදී. උපාධි අපේක්ෂකයින් සහ විශ්වවිද්‍යාලවල ඔවුන්ගේ අධීක්ෂකවරුන් අතර අවධානය යොමු වූ පර්යේෂණ ගණන වැඩි කිරීමේ අරමුණින් NRDF හි ප්‍රධාන කේන්ද්‍රගත ක්ෂේත්‍රයන් 10 ක් යටතේ හඳුනාගන්නා ලද ගැටළු / ප්‍රශ්න කරා විසඳුම් සොයා ගැනීම සඳහා රටේ පර්යේෂණ සංවර්ධන ක්‍රියාකාරකම් යොමු කිරීම වෙනුවෙන් 2017 දී ආරම්භ කරන ලද ක්‍රියාකාරකම් වලින් එකක් වනුයේ ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (NURS) වේ.

නස්ටෙක් ආයතනය සිය දෙවන ජාතික උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය 2019 මාර්තු 29 වන දින කෝට්ටේ රාජගිරියේ පිහිටි බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ (CBS) සංවිධානය කරන ලදී. කොළඹ විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එම්. නලින් ද සිල්වා විශේෂ ආරාධිත අමුත්තා සහ ප්‍රධාන කථිකයා ලෙස සමාරම්භක උත්සවයේදී සහභාගී වූ උපාධි අපේක්ෂකයින් ආමන්ත්‍රණය කරන ලදී. ආහාර, පෝෂණය සහ කෘෂිකර්මාන්තය, සෞඛ්‍ය, නිවාස, පරිසරය, බලශක්ති, තොරතුරු තාක්ෂණ හා දැනුම් සේවා, මූලික විද්‍යා, නැගී එන තාක්ෂණයන් සහ දේශීය දැනුම ඇතුලත් NRDF හි කේන්ද්‍රීය අංශ හතක් යටතේ සමගාමී සැසිවාර දෙකකදී උපාධි අපේක්ෂකයින් සිය පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කරන ලදී. සෑම සැසිවාරයකම හොඳම ඉදිරිපත් කරන්නන් කුසලතා සහතික සම්මානයට පාත්‍ර විය

.



රූපසටහන 13: රාජගිරිය බැංකු අධ්‍යයන පරිශ්‍රයේදී පැවැත්වූ දෙවන උපාධිඅපේක්ෂකයින්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය. 2019

නස්ටෙක් කාර්යය (5): ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය කැඳවීම

ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා විද්‍යා හා තාක්ෂණ ආයතන (STI) ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සාකච්ඡා කිරීම සඳහා අමාත්‍යාවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය (BICOST) කැඳවීම නස්ටෙක් හි අනිවාර්ය කාර්යයන්ගෙන් එකක් වේ. 9 වන ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය (BICOST IX) 2018 නොවැම්බර් 9 වන දින පැවැත්වීමට නියමිතව තිබුණද, එවකට පැවති රජයේ වාතාවරණය සැලකිල්ලට ගනිමින් එය 2019 නොවැම්බර් 4 දිනට කල් තබන ලදී.

200 වන කොමිෂන් සභා රැස්වීමේදී, ජාතික STI උපාය මාර්ග සංවර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් 2020 වර්ෂයේදී 9 වන ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය (BICOST IX) පැවැත්වීමට තීරණය විය.

අනෙකුත් ක්‍රියාකාරකම්

ශිල්පසේනා ප්‍රදර්ශනය - ශ්‍රී ලංකාවේ තාක්ෂණික විප්ලවය

දේශීය මට්ටමින් දැනුම ව්‍යාප්ත කිරීමට හා තාක්ෂණික දැණුම හුවමාරු කිරීම සඳහා පහසුකම් සපයමින් පර්යේෂණ වාණිජකරණය කිරීම උදෙසා වේදිකාවක් නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණක් ඇතිව ශිල්පසේනා - ශ්‍රී ලංකාවේ තාක්ෂණික විප්ලවය 2019 ප්‍රදර්ශනය දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් මූලික පියවර ගන්නා ලදී. මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරීම සඳහා නස්ටෙක් ආයතනයද සහභාගී වූ අතර ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස් (IOT) සහ 5G යන තාක්ෂණික තේමාව සම්බන්ධීකරණය කිරීමටද දායකත්වය ලබා දෙන ලදී. පළමු හා ප්‍රධාන ඉසව්ව 2019 ජූලි 18 සිට 21 දක්වා බන්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි (BMICH) පැවැත්වූ අතර දෙවන ඉසව්ව 2019 සැප්තැම්බර් 24 සිට 29 දක්වා පොලොන්නාරුවේදී පැවැත්විය. ඩයලොග්, මොබිටෙල්, තින්ගර්බිට්ස්, UNIVOTEC, KDU, SLIIT සහ ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වැනි තාක්ෂණික තේමාවට අදාළ තෝරාගත් පාර්ශ්වකරුවන් මෙම ඉසව් සඳහා සහභාගී වූහ. අමාත්‍යාංශයේ වාර්තාවලට අනුව පාසල් සිසුන් සහ මහජනතාව ඇතුළු ලක්ෂයකට අධික පිරිසක් IOT & 5G තාක්ෂණ තේමා කුටිය නැරඹීමට පැමිණ ප්‍රතිලාභ ලබා ගන්නා ලදී.



රූපසටහන 14: ක්ෂේත්‍ර 12 අදාල ශිල්පසේනා ප්‍රදර්ශණය



රූපසටහන 15: BMICH හී පැවැත්වූ ශිල්පශේනා ප්‍රදර්ශණය

නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල විද්‍යා සහ තාක්ෂණය සඳහා මධ්‍යස්ථානය (NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය)

නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් වල විද්‍යාව හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය, www.namstct.org), 1989 අගෝස්තු මාසයේ සිට ඉන්දියානු රජය විසින් සත්කාරත්වය දරන ලද අන්තර් - රාජ්‍ය සංවිධානයක් වන අතර විද්‍යා හා තාක්ෂණය පිළිබඳ දකුණු - දකුණු සහයෝගීතාවය ප්‍රවර්ධනයේදී ඉතා ක්‍රියාශීලී සංවිධානයකි. ලතින් ඇමරිකානු, අප්‍රිකානු, ආසියානු හා යුරෝපීය මහදිවීපයන් පුරා පැතිරුණු මධ්‍යස්ථානයේ සම්මානනීය සාමාජික රටවල් 47 අතරින් එක් රටකී ශ්‍රී ලංකාව එක් රටක් වේ. එම සංවිධානය නොබැඳුනු සිට වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල් දක්වා විද්‍යාඥයින්, තාක්ෂණ විද්‍යාඥයින් සහ විද්‍යාත්මක සංවිධාන අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සමඟ වරප්‍රසාද සහයෝගීව සපයනු ලැබේ. මේ වන විට එම NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් මෙවැනි ජාත්‍යන්තර වැඩමුළු 07ක් ශ්‍රී ලකාවේ කොලඹ හා නුවර ප්‍රදේශවල පැවැත්වුනි. ශ්‍රී ලංකාව ඇතුළත්ව ගෝලීයව පර්යේෂකයින් හා වෘත්තිකයින් විශාල සංඛ්‍යාවකට එයින් ප්‍රතිලාභ සැලසුණි. පසුගිය 2004, 2010 හා 2018 දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා තුනකදී පාලක සභා කාර්යංශ කමිටු රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව විසින් සත්කාරත්වය සලසන ලදී.

මධ්‍යස්ථානයේ සාමාජික රටවල් විසින් සංවිධානය කරන ලද වැඩමුළු, සමුළු, සංසද හා කෙටිකාලීන හා මධ්‍යකාලීන පුහුණු වැඩසටහන් වලට විද්‍යාඥයින් හා අනෙකුත් නිලධාරීන්හටසහභාගී වීම සඳහා NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් අවස්ථාව සළසා දී තිබුණි. මෙම වැඩසටහන් සඳහා මධ්‍යස්ථානය ගුවන් ගාස්තු සපයනු ලබන අතර සත්කාරක රටවල් සහභාගීවන්නන්හට නවාතැන් පහසුකම් සපයනු ලැබයි.

2019 වර්ෂය තුල මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සැසි සඳහා පහත සඳහන් ශ්‍රී ලාංකික විද්‍යාඥයින් සහභාගී විය

- **සංවර්ධනය වෙමින් පවතින රටවල සම්භාණ්ඩ අංශයේ තිරසාරත්වය තහවුරු කිරීම සඳහා ප්‍රධාන පරාමිතීන් සංවර්ධනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව: 2019 ජනවාරි 28 සිට 31 දක්වා ඉන්දියාවේ චෙන්නායි හී**
  ආර්.ඩී.එන්. විජේසිංහ මිය, පරිවාස කථිකාචාර්ය, රුහුණු විශ්ව විද්‍යාලය

- **සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන තාක්ෂණවේදය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළු - 2019 මාර්තු 11 සිට 15 දක්වා මැලේසියාවේ ක්වාලාලම්පූර් හී**
  පී.එන්.ඩී. පතිරන මිය, සහකාර අධ්‍යක්ෂ - අලෙවිකරණ, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය.

- **ඒකාබද්ධ NAM මධ්‍යස්ථාන - ASRT, EGYPT සාමාජිකත්ව වැඩසටහන: ඊජිප්තුවේ**
  ධක්ශිලා නියංගොඩ මෙය, කථිකාචාර්ය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

- **විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ජනප්‍රිය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වන ජාත්‍යන්තර වැඩමුළුව: ඉරානයේ ටෙහෙරානය, 2019 ජූනි 17 සිට 19 දක්වා**
  පී.එම්. ධර්මතිලක මහතා, අධ්‍යක්ෂ, විද්‍යා හා පර්යේෂණ සංවර්ධන, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

- **ඒකාබද්ධ NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය - NABDA ආරාධික විශේෂඥ සාමාජිකත්ව වැඩසටහන: 2019–2020 සඳහා අයදුම්පත් කැඳවීම, නයිජීරියාව**
  ආචාර්ය සංජය දීපාල් නයන කුමාර බතිගේ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ, ශ්‍රී ලංකා නැනෝතාක්ෂණික ආයතනය (SLINTEC)

- **'සංවර්ධනය වෙමින් පවතින රටවල නවෝත්පාදකයින් සඳහා වන ව්‍යවසායකත්ව කුසලතා' පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන: 2019 ඔක්තෝබර් 23 සිට 25 දක්වා ඊජිප්තුවේ කයිරෝ හී**
  ජයසමාරා ගුණරත්න මෙය, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ හුවමාරු)

- **'විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික ඩිප්ලෝමා පාඨමාලාව' : 2019 නොවැම්බර් 28 සිට දෙසැම්බර් 03 දක්වා දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියා හී**
  කේ.වී. තාරක ගුණවර්ධන මහතා, පර්යේෂණ විද්‍යාඥ, ආහාර තාක්ෂණ අංශය, කාර්මික තාක්ෂණ ආයතනය,
  සෙසු නම් කළ අය - (i) ආචාර්ය රනිල් ඩී. ගුණරත්න, ප්‍රොවොස්ට්, SLINTEC ඇකඩමිය

- **NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයෙහි 14 වන පාලක මණ්ඩලයේ 2 වන කාර්යාංශ රැස්වීම: 2019 සැප්තැම්බර් 5 සහ 6 යන දිනවල වියට්නාමයේ හැනෝයි හී**
  චින්තක එස්. ලොකුහෙට්ටි මහතා, ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
  ඩී. නන්දනී සමරවික්‍රම මහත්මිය, වැඩබලන අධ්‍යක්ෂ, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම් සභාව
  එන්. පී. ජේ දිනුෂිකා මෙය, සහකාර ලේකම් (පාලන), විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
  තිලිනි මුණගමගේ මෙය, විද්‍යාඥ, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම් සභාව

මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ උපදේශක කටයුතු ලබා දෙන ඉහළම ආයතනය ලෙස නස්ටෙක් ආයතනය නම් කර ඇත. ඉහත කර්තව්‍යය ඉටු කිරීම සඳහා ආයතනික අරමුණු හා පරමාරථයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා කණ්ඩායමක් ලෙස නස්ටෙක් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර රටේ විද්‍යා හා තාක්ෂණයේ සංවර්ධනය සඳහාද සේවා සපයනු ලබයි.

නස්ටෙක් හි ආයතනික ව්‍යුහයට අනුව සභාපති කොමිෂන් සභාවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ. නස්ටෙක් හි අනුමත සේවක සංඛ්‍යාව 18 කි. ජ්‍යෙෂඨ විද්‍යාඥ විසින් විශේෂඥ අධ්‍යයන කණ්ඩායම් සහ උපදේශන සංසද මෙන්ම නස්ටෙක් හි අනෙකුත් සියලුම විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයමින් ඒවා සම්බන්ධීකරණය හා කළමනාකරණය කරනු ලබයි. සියළුම මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන) වගකිව යුතුය. විද්‍යාඥයින් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ට සහාය වන අතර අධ්‍යයන කණ්ඩායම් සහ උපදේශන සංසද සහ නස්ටෙක්හි අනෙකුත් අදාළ විද්‍යාත්මක ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලබයි. සහායක කාර්ය මණ්ඩලය පරිපාලන නිලධාරී, වැඩසටහන් සහායකයින් දෙදෙනෙකු (වැඩසටහන් සහකාර-මූල්‍ය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දත්ත ගබඩා සහායක), පිළිගැනීමේ සහකාර හා දුරකථන ක්‍රියාකරුවෙකු ඇතුළු කළමනාකරණ සේවා සහායකයින් පස් දෙනෙකු, කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු සහ රියදුරන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. කොමිසම් සභාවට අවශ්‍ය පරිදි විශේෂිත කාර්යයන් හා පැවරුම් ඉටු කිරීම සඳහා, අවශ්‍යතා මත පදනම්ව උපදේශකයින් සහ පර්යේෂණ සහායකයින් ගෙවීමේ පදනම මත ලබා ගනු ලැබේ.

2019.12.31 දිනට කාර්ය මණ්ඩල පිළිබඳ සාරාංශගත තොරතුරු

කාර්ය මණ්ඩල කාණ්ඩය	අනුමත කාර්ය මණ්ඩලය	තක්‍ෂ කාර්ය මණ්ඩලය
ඉහළ කළමනාකරණය (HM 2-3)	01	01
විද්‍යාඥයින් (AR -2, AR – 1)	04	04
මධ්‍යම කළමනාකරු (MM)	01	01
කණිෂ්ඨ කලමනාකරු (JM)	01	01
කළමනාකරණ සහකාර (MA 3)	02*	02
කළමනාකරණ සහකාර (MA 1- 2)	05	02
ප්‍රාථමික මට්ටම (PL)	05	05

02* වැඩසටහන් සහකාර තනතුර - මූල්‍යය තනතුර දරණු ලබන නිලධාරිට පුද්ගලිකය

- 2018 මාර්තු 09 සිට 2019 ජුනි 14 දක්වා වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ඉංජිනේරු ඩී. ඩී. ආනන්ද නාමල් මහතා සිය ධුර කාලය තුළ කළ සේවය වෙනුවෙන් අපි ඔහුව අගය කරමු.

- 2019 ජුනි 20 සිට 2020 ජනවාරි 26 දක්වා නස්ටෙක් හි වැඩබලන අධ්‍යක්ෂක ලෙස පත්වූ නන්දනී ඩී. සමරවික්‍රම මහත්මිය නස්ටෙක් විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබීය.

- 2019 මාර්තු 05 වන දින සිට නස්ටෙක් හි සභාපතිනිය ලෙස පත්වූ මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු නස්ටෙක් විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබීය.

- මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු 2019 ජුනි මාසයේදී සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූ අතර අප ඇයගේ සේවය අගය කරන්නෙමු
- 2019 ජුලි 9 වන දින සිට නස්ටෙක් හි සභාපතිනිය ලෙස පත්වූ මහාචාර්ය නිරංජනී රත්නායක නස්ටෙක් විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබීය.

- 2019 නොවැම්බර් 28 වන දින මහාචාර්ය නිරංජනී රත්නායක සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූ අතර අප ඇයගේ සේවය අගය කරන්නෙමු.

- 2019 අගෝස්තු මස ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සෙයිද් ෂහ්මී මහතා ජාතික පර්යේෂණ සභාවේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබීම අපි අගය කරන්නෙමු.

- 2019 නොවැම්බර් 19 වන දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව බත්තරමුල්ල සෙත්සිරිපය හි පිහිටි නව කාර්යාල පරිශ්‍රයට ගෙන ගියේය.

- මැලේසියාවේ 2019 අගෝස්තු 13 දින පැවති AKEPT විද්‍යා උපදේශක සැසිවාර වැඩමුළුවකදී ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සෙයිද් ෂහ්මී මහතා ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග සිදුවීම් වැඩි වීමේ හා ජාතික විද්‍යා උපදේශක පද්ධතිය පිළිබඳව කතාවක් පවත්වන ලදී.



රූපසටහන 16: නස්ටෙක් ආයතනය සෙත්සිරිපාය නව කාර්යාල පරිශ්‍රයට ගෙන යාම



රූපසටහන 17: 2019 අගෝස්තු මාසයේ විද්‍යා පර්යේෂණය සඳහා ජාතික පර්යේෂණ සභාවේ ජනාධිපති සම්මානය

ධාරිතා වර්ධනය සහ ඵලදායිතා සංවර්ධනය

අංකය	නම	තනතුර	විස්තරය	දිනය	ස්ථානය
1	එච්.ඒ.සී. සංජීවනි මෙය	කළමනාකරණ සහකාර	දේපළ සහකාර, ස්ථාවර වත්කම් පාලනය	2019 ජනවාරි 29	SDFL
2	ජයශාන්ත ප්‍රබාත් මහතා	රියදුරු	රියදුරන්ගේ හා සුළු සේවකයින්ගේ රාජකාරි කටයුතු හා වගකීම්	2019 මාර්තු 11 හා 12	SDFL
3	කනිෂ්ක ගිම්හාන් මහතා	කාර්යාල සහායක	රියදුරන්ගේ හා සුළු සේවකයින්ගේ ආචාරධර්ම හා විනය කටයුතු	2019 මාර්තු 18 සහ 19	SDFL
4	ලක්මිනි උඩුගම මෙය	පරිපාලන නිලධාරී	බදවා ගැනීමේ ක්‍රියාවලිය	2019 ජූනි 13	ග්‍රෑන්ඩ් ඔරියන්ට් හෝටලය Hotel
5	ශෂින්ත සේනානායක මහතා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දත්ත ගබඩා සහායක	තාක්ෂණික උපකරණ ප්‍රසම්පාදනය	2019 ජූනි 27	SDFL
6	ඉෂාරා කුල්ෂානි මෙය	පිළිගැනීමේ නිලධාරී	නිවාඩු ලිපිකරුගේ රාජකාරි හා වගකීම්	2019 ජූලි 25 හා 26	SDFL
7	නිශාන්ති මහරගේ මෙය	කළමනාකරණ සහකාර	කාර්යාල ලිපි හා රැස්වීම් සටහන් ලිවීම	2019 ඔක්තෝබර් 31	ජාතික කම්කරු අධ්‍යයන ආයතනය
8	තුසිත රත්නායක මහතා	වැඩසටහන් නිලධාරී	වැටුප් පරිවර්තනය	2019 නොවැම්බර් 28	ශ්‍රී ලංකා පදනම් ආයතනය
9	තුසිත රත්නායක මහතා	වැඩසටහන් නිලධාරී	වැටුප් පරිවර්තනය	2019 දෙසැම්බර් 19	ශ්‍රී ලංකා පදනම් ආයතනය

බාහිර පුහුණු වැඩසටහන්

බාහිර පුහුණුව යනු අත්දැකීම් සහිත ඉගෙනීම තුළින් සේවකයින්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා භාවිතා කරන ධාරිතා වර්ධන වැඩසටහනකි. මෙය කණ්ඩායම් හැකියා වර්ධනයට සහ නායකත්ව ගුණාංග වැඩි දියුණු කිරීමට සහය වන අතර අන්තර් කණ්ඩායම් හෝ පෞද්ගලික ගැටුම් නිරාකරණය කිරීමටත්, අන්තර් පුද්ගල කුසලතා පෝෂණය කිරීමටත්, පුද්ගලික හා අන්තර් කණ්ඩායම් සබඳතා පෝෂණය කිරීමට සහ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීමටත් එය උපකාරී වේ.

2019 මැයි 09 සිට 10 දින දක්වා NERD මධ්‍යස්ථානයේ පැවැත්වූ බාහිර පුහුණු වැඩසටහනකට නස්ටෙක් කාර්ය මණ්ඩලය සහභාගී විය. නස්ටෙක් කාර්ය මණ්ඩලය සහභාගී වූ 2 වන පුහුණු වැඩසටහන මෙයවේ.



රූපසටහන 18: NERD ආයතනයේ පැවැත්වූ බාහිර පුහුණු වැඩසටහන

උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැකසීම

නස්ටෙක් ආයතනයෙන් ලබාදුන් මූල්‍ය අනුග්‍රහය මත මුදල් හා පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂ කුමාරි පීරිස් මහත්මිය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති (MPM) පාඨමාලාවේ දෙවන වසර අඛන්ඩව කරගෙන ගියාය.

අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

2019 දෙසැම්බර් 30 වන දින 'කාර්යාල කාර්ය පටිපාටි' පිළිබඳ අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් නස්ටෙක් විසින් සංවිධානය කරන ලදී. සැසිය මෙහෙයවූ සම්පත්දායකයා වූයේ ජේ. යූ. ප්‍රියනාත් මහතා (පරිපාලන නිලධාරී; මැතිවරණ කොමිසම් සභාව). ඔහු විෂය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික අත්දැකීම් වලින් උපුටා ගත් වටිනා අවබෝධයක් ලබා දුන්නේය. එය සාර්ථක වැඩසටහනක් වූ අතර නස්ටෙක් සේවකයින්ට ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට සහ නව ඉගෙනීමට අවස්ථාව ලැබුණි.

සුබසාධන කාර්යයන්

නස්ටෙක් සුභසාධක සමිතිය 2014 අප්‍රේල් 14 වන දින ආරම්භ කරන ලදී. සමාරම්භක අවස්ථාවේ සභාපතිවරයා වූයේ මහාචාර්ය ධම්මික තන්ත්‍රිගොඩ ය. පළමු සභාපතිවරයා වූයේ කාර්යාල සහායක නිශාන්ත පියදස මහතා වන අතර පළමු ලේකම් වනුයේ කළමනාකරණ සහකාර නිල්මිනි පෙරේරා මහත්මියයි. එහි සාමාජිකයින් සඳහා පළමු වාර්ෂික රැස්වීම 2017 අප්‍රේල් මාසයේ දී සංවිධානය කරන ලදී. මෙම සුභසාධක සමිතිය විසින් සිදු කරනු ලබන වැඩසටහන් සහ උත්සව පහත දැක්වේ.

<u>උත්සව</u>

- එක් දින චාරිකා සංවිධානය - 2016 කන්නෙලිය
- ගංවතුර සහනාධාර වැඩසටහනකට සහභාගී වීම - 2016

<u>දෛනික කාර්යයන්</u>

- සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද සඳහා කාර්ය මණ්ඩලය වෙත අඩු පොළි ණය පහසුකම් වාර්ෂිකව ලබා දීම.

<u>වැඩසටහන්</u>

- නස්ටෙක් කාර්ය මණ්ඩලය සඳහා 2019 දී ටී ෂර්ට් මුද්‍රණය කර ලබාදෙන ලදී.

විදේශ පුහුණු / වැඩමුළු / සම්මන්ත්‍රණ / සංසද සඳහා සහභාගී වීම

නම	තනතුර	පුහුණුව / වැඩමුළු / සම්මන්ත්‍රණ / සංසද	රට	කාලය
ආචාර්ය කල්ප සමරකෝන්	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ	ඵලදායි විද්‍යා ආකෂණ හා නවොත්පාදන සංවර්ධනය පිළිබඳ වැඩමුළුව	ඉන්දියාව	2019 මාර්තු 6 සිට 8
ඩී.නන්දනී සමරවික්‍රම මහක්මිය	වැඩබලන අධ්‍යක්ෂ	STEPI ප්‍රතිපත්ති වැඩමුළුව	දකුණු කොරියාව	2019 ජූනි 24 - 29
ආචාර්ය කල්ප සමරකෝන්	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ	STEPI ප්‍රතිපත්ති වැඩමුළුව	දකුණු කොරියාව	2019 ජූනි 24 - 29
සෙයිඩ් ෂහ්මි මහතා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ	STEPI ප්‍රතිපත්ති වැඩමුළුව	දකුණු කොරියාව	2019 ජූනි 24 - 29
සෙයිඩ් ෂහ්මි මහතා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ	නැගෙනහිර ආසියාවේ බෝ නොවන රෝග පිළිබඳ ධාරිතා වර්ධන වැඩමුළුව - විද්‍යා උපදෙස්	මලයාසියාව	2019 අගෝස්තු 13 සහ 14
ඩී. නන්දනී සමරවික්‍රම මහක්මිය	වැඩබලන අධ්‍යක්ෂ	**NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයෙහි 14 වන පාලක මණ්ඩලයේ 2 වන කාර්යාංශ රැස්වීම**	හැනොයි, වියට්නාමය	2019 සැප්තැම්බර් 5 සහ 6
තිලිනි මුණගමගේ මෙය	විද්‍යාඥ	**NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයෙහි 14 වන පාලක මණ්ඩලයේ 2 වන කාර්යාංශ රැස්වීම**	හැනොයි, වියට්නාමය	2019 සැප්තැම්බර් 5 සහ 6



රූපසටහන 20: ඵලදායී විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන සංවර්ධන පුහුණු වැඩමුළුව



රූපසටහන 19: STEPI- නස්ටෙක් STI ප්‍රතිපත්ති වැඩමුළුව 2019



රූපසටහන 21: නැගෙනහිර ආසියාවේ STI ධාරිතා වර්ධන වැඩමුළුව - විද්‍යා උපදෙස්



රූපසටහන 23 : NAM S&T මධ්‍යස්ථානයෙහි 14 වන පාලක මණ්ඩලයේ 2 වන කාර්යාංශ රැස්වීම

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන්	2019	2018
ආදායම			
පුනරාවර්තන ප්‍රධාන		25,579,500	29,134,006
මූලධන ප්‍රධාන - පර්යේෂණ හා සංවර්ධන	12	3,160,500	13,332,325
මූලධන ප්‍රධාන - ධාරිතා වර්ධනය		430,000	157,000
රජයේ ප්‍රධාන ක්‍රමක්ෂය කිරීම - ක්ෂය		4,317,572	4,359,709
අනෙකුත් ආදායම	13	111,538	166,078
		33,599,110	**47,149,118**
වියදම			
පුද්ගලික පඩිනඩි	14	14,092,911	12,339,312
ගමන් වියදම්	15	461,916	752,381
සැපයුම් හා භාවිතා කළ පරිභෝජ්‍ය ද්‍රව්‍ය	16	675,097	683,688
නඩත්තු	17	1,875,013	912,966
ගිවිසුම්ගත සේවා	18	9,655,675	8,527,823
මාරු කිරීම්	19	4,335,387	3,971,448
ධාරිතා වර්ධනය	20	439,225	218,380
පර්යේෂණ හා සංවර්ධනය	21	2,032,708	9,307,956
රැස්වීම් වියදම්	22	161,471	1,564,845
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	6	4,317,572	4,359,709
මුළු වියදම් ක්‍රමක්ෂය		**38,946,975**	**42,638,508**
මෙහෙයුම් කටයුතු වලින් අතිරික්තය/ (ඌනතාවය)		**(5,347,865)**	**4,510,610**
මූල්‍ය පිරිවැය			
දේපල, පිරියත හා උපකරණ මත වාසිය		-	-
වාහන රක්ෂණය		-	-
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය)		**(5,347,865)**	**4,510,610**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2019 දෙසැම්බර් 31 දිනට
(සියලු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන්	2019	2018
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	2,365,493	7,420,521
වෙළඳ හා වෙනත් ලැබිය යුතු	2	-	-
ඉන්වෙන්ට්‍රි / තොග	3	93,110	100,112
පූර්ව ගෙවීම්	4	128,513	1,039,219
සේවක ණය - කෙටිකාලීන	5	225,792	205,796
		2,812,908	**8,765,648**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	6	5,087,612	8,107,344
ආපසු ගෙවිය යුතු තැන්පතු	7	260,670	1,275,500
සේවක ණය - දිගුකාලීන	8	425,511	443,303
		5,773,793	**9,826,147**
මුළු වත්කම්		**8,586,701**	**18,591,795**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	9	5,508,452	7,856,423
ජංගම නොවන වගකීම්			
විලම්බිත ආදායම්	10	1,444,461	774,243
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	11	3,489,111	2,780,798
		4,933,572	**3,555,041**
මුළු වගකීම්		**10,442,024**	**11,411,464**
මුළු ශුද්ධ වත්කම්		**(1,855,323)**	**7,180,331**
ශුද්ධ වත්කම් / හිමිකම්			
සමුච්චිත අරමුදල		1,907,071	1,904,910
ප්‍රතයාගණන අතිරික්තය		6,159,307	9,849,258
සංචිත		(9,921,701)	(4,573,837)
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		**(1,855,323)**	**7,180,331**

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 හි දක්වා සටහන් පිටු අංක 07 සිට 11 හි දක්වා අ ඇත.. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතුවේ. මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් අනුමත කර පහත පරිදි අත්සන් තබා ඇත.

සභාපති

වැඩබලන අධ්‍යක්ෂක

නියෝජ්‍ය අධ්‍යක්ෂක
මුදල් හා පාලන

කොමිෂන් සභාවේ සාමාජික

මගේ අංකය / எனது இல. / My No. } ටීඊසී/ඒ/එන්ඒඑස්ටීඊසී/03/03/2019 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 22 දින

සභාපති,

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 112 ඡේදයේ දක්වා ඇති කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිතිරීති/ විධිවිධානවලට යොමුව	විස්තරය
(අ) 2003 ජුනි 02 දිනැති හා අංක PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය	විගණන හා කළමනාකරණ කමිටුව මාස 03කට වරක් හෝ කැඳවිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය තුලදී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.
(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2010 දෙසැම්බර් 10 දිනැති හා අංක 1/2010 දරන චක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය	රාජ්‍ය ව්‍යවසායන්හි හා විශ්වවිද්‍යාල අනධ්‍යන කාර්ය මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් දරන වසර 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විධායක නිලධාරීන් හට පමණක් තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබාදිය හැකි වුවද අවුරුදු 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයාට තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබාදී තිබීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කොමිෂන් සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ආ) වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචන වාර්තාවක් සමාලෝචිත වර්ෂයේදී සකස් කළ යුතු වුවද එම කටයුතු අවසන් කර නොතිබුණි. 2019 වර්ෂය සඳහා වූ වාර්තාවද මූලික අදියරෙහි පැවතුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක 2018 පෙබරවාරි 20 දින සිට වාහම ක්‍රියාත්මක වන පරිදි විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කර තිබූ අතර 2018 ජුනි 19 දිනැති කොමිෂන් සභාවේ පාලක මණ්ඩල වාර්තාව අනුව 2018 ජූලි 09 දින අනිවාර්ය නිවාඩු ලබාදී තිබුණි. එබැවින් මෙම නිලධාරියා වෙත 2018 මාර්තු 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කරන ලද රු.3,036,619 ක මුදල ආර්ථික නොවන වියදමක් බවට පත් වී තිබුණි.

(ආ) විද්‍යාව හා තාක්ෂණය (S&T) ආශ්‍රිත ප්‍රතිපත්ති, උපාය මාර්ග සැලසුම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (STI) උපාය මාර්ග සංවර්ධනය කිරීමේ කටයුතුවලින් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැසුමට අනුව නිම කළ යුතු කාර්යයන්ගෙන් සියයට 10 ක ප්‍රමාණයක කටයුතු පමණක් ඉටු කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) විද්‍යාව සහ තාක්ෂණය (S&T) සම්බන්ධව ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට අදාල කටයුතුවලින් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් අනුව වර්ෂය තුලදී ඉටුකළ යුතු කටයුතුවලින් 50 ක් පමණක් අවසන් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ (S&T) තත්ත්වය තක්සේරු කිරීමේ ව්‍යාපෘතියේ දත්ත සමුදාය (Database) සංවර්ධනය කිරීම ප්‍රවර්ථන වර්ෂය තුලදී සිදු කිරීමට සැලසුම් කර තිබුණද එයින් සියයට 60 ක ප්‍රමාණයක් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී අවසන් කර තිබුණි.

(ඉ) විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (STI) පිළිබඳව රජයට උපදෙස් දීම සඳහා පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියට අදාලව ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්, තරුණ විද්‍යාඥයින් සහ වෙනත් ව්‍යත්තීය සංවිධානවල විද්‍යාඥයින්ගෙන් සමන්විත වැඩකරන කණ්ඩායම් ආරම්භ කිරීමේ කටයුතුවලදී 2019 වර්ෂයේදී මෙහෙයුම් කමිටු රැස්වීම් 10 ක් පැවැත්වීමට නියමිතව තිබුණද රැස්වීම් 6 ක් පමණක් පවත්වා තිබුණි.

(ඊ) කොමිෂන් සභාව විසින් ද්විවාර්ෂිකව පවත්වනු ලබන විද්‍යා හා තාක්ෂණය පිළිබඳ 9 වන ශ්‍රී ලංකා ද්විවාර්ෂික සමුළුවේ ඉසව් කළමනාකරණය සඳහා රු.337,300 ක මුදලක් පුද්ගලික ආයතනයට ගෙවා ඇති නමුත් එම සමුළුව පවත්වා නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ඔබ විසින් එවන ලද 2020 ජූලි 09 වන දිනැති TEC/A/NASTEC/03/03/2019 දරණ ඉහත වාර්තාවට අදාල පැහැදිලි කිරීම් පහත දැක්වේ.

2.1 ලිඛිත නීතිරීති හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූල නොවීම

(අ) 2019 වර්ෂයේ පළමු කාර්තුවේදී, 2018 වර්ෂයට අදාළ විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ වාර්තාව පෙර වසර වල සකස් කල ආකෘතියෙන් බැහැරව නව සැලසුමකට ද්විතියික දත්ත උපයෝගී කරගෙන සකස් කිරීමට නව NASTEC කොමිෂන් සභාව විසින් 2019 06. 11 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව එම වාර්තාව සමස්ත විද්‍යා හා තාක්ෂණ ප්‍රජාව ඇතුලත්වන පරිදි සකස් කර 2020 වර්ෂයේ මුද්‍රණය කිරීමට තීරණය කරන ලදී. එබැවින් 2019 දෙවන කාර්තුව අවසාන වන විටද පෙර වර්ෂ වල මෙන් දත්ත එක්රැස් කිරීමේ ප්‍රශ්නාවලිය ආයතන වලට යැවීම සිදු නොකරන ලදී.

නව උපායමාර්ගික මගපෙන්වීම් සඳහා ඉහත කොමිෂන් සභා රැස්වීමේදී කොමිෂන් සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් අතුරු කමිටුවක් පත් කර මේ පිළිබඳ අධ්‍යනය කිරීමට භාර කරන ලදී. එහිදී තීරණය වූයේ නැවත පෙර වර්ෂවල මෙන් ආයතන වලට ප්‍රශ්නාවලිය යවා දත්ත එක්රැස් කිරීමටය. එබැවින් 2019 අගෝස්තු මාසයේ ආයතන වලට ප්‍රශ්නාවලිය යැවීම සිදු කරන ලදී. ආයතන වලින් ප්‍රශ්නාවලිය හරහා දත්ත එක්රැස් කිරීම 2020 ජනවාරි මස දක්වා සිදු කෙරුණු අතර එයට හේතුව ඇතැම් ආයතන වලින් දත්ත ලබා දීම ප්‍රමාද වූ බැවිනි.

2020 වසරේ ජනවාරි මස සිට ජුනි මස දක්වා එක්රැස් කල දත්ත සම්පාදනය කිරීම, විශ්ලේෂණය කිරීම හා 2018 විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ වාර්තාව සැකසීම සිදු කරන ලදී. 2020 මාර්තු සිට මැයි මස දක්වා කොවිඩ් - 19 තත්ත්වය යටතේ ආයතන වල වැඩ කටයුතු නිවසේ සිට සිදු කිරීමට සිදු වූ නිසා වාර්තාව අවසන් කිරීමට කාලයක් ගත විය. 2018 විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ වාර්තාව සඳහා අවශ්‍ය නිර්දේශ සැකසීම හා වාර්තාවේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම මේ වන විට සිදු වන අතර 2020 ඔක්තෝබර් මස වන විට වාර්තාව මුද්‍රණය කර අවසන් කිරීමට අපේක්ෂා කරයි.

(ආ) 2019 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත්වීමට සැලසුම් කළද ජනවාරි, පෙබරවාරි සහ දෙසැම්බර් මාස වල කොමිසමක් නොතිබූ අතර අප්‍රේල් සහ මැයි මස වල කොමිෂන් සභා රැස්වීම් නොපැවැත්වීණි. විගණන කමිටු රැස්වීමකට කොමිෂන් සභාවේ සාමාජිකයින් දෙදෙනෙකුගෙන් යුත්

සංයුතියක් අවශ්‍ය වේ. කොමිෂන් සභා සාමාජිකයින් දෙදෙනා ජුනි මස 201 වන රැස්වීමෙන් පත් කර ඇත. එම නිසා මෙම වර්ෂයේ විගණන කමිටු රැස්වීම් 2 ක් පමණක් පැවැත්වීමට හැකි විය.

(ඇ) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 207 වන කොමිෂන් සභා රැස්වීම මගින් 2017 සහ 2018 වාර්ෂික වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කිරීම සඳහා අනුමැතිය ලැබුණි. ඒ අනුව වාර්ෂික වාර්තා දෙකට අදාළ භාෂා පරිවර්තන මේ වන විට සිදු කර අවසන් අතර සාරාංශ වාර්තාව පරිවර්තනය කරමින් පවතී. 2017 වාර්ෂික වාර්තාවේ පිටපතක් 2020.02.14 දින අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. ඒ අනුව ඉදිරි සති දෙක තුල වාර්ෂික වාර්තා දෙකට අදාළ පිටපත් පාර්ලිමේන්තුවේ සභා ගත කිරීම සඳහා සාරාංශ වාර්තාව සමඟ අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු සුදානම් කර ඇත. 2019 වාර්ෂික වාර්තාව ද අගෝස්තු මස පැවැත්වෙන කොමිෂන් සභා රැස්වීමේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතයි. එම වාර්තාව නියමිත කාලයට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමු කළ හැකිය.

2.2 ආර්ථික නොවූ ගනුදෙනු

ආයතනයේ හිටපු අධ්‍යක්ෂකතුමා 2018 ජූලි මස 9 වන දින පැවති 193 කොමිෂන් සභා රැස්වීම මගින් අනිවාර්ය නිවාඩු යවන ලදී. එම කොමිෂන් සභා වාරයේදී හිටපු අධ්‍යක්ෂකතුමා හට මූලික වැටුප සහ දීමනා (ජීවන වියදම් දීමනාව සහ වෘත්තිමය දීමනාව) ගෙවීමට තීරණය කරන ලදී. ඒ අනුව එම වැටුප ගෙවීම මූලික පරීක්ෂණය අවසන් වන තෙක් එනම් 2020 ජුනි මස දක්වා ක්‍රියාත්මක විය. කොමිෂන් සභාවේ නව සභාපතිනි 2020 ජනවාරි මස 16 වැඩ භාර ගැනීමෙන් පසුව මේ සඳහා වැඩි අවධානයක් යොමු කල අතර වැඩ බලන අධ්‍යක්ෂ සමඟ මූලික විමර්ශන වාර්තාව 2020 අප්‍රේල් මස ගෙන්වා ගන්නා ලදී. එම වාර්තාවේ නිර්දේශ ජුනි මස පැවති කොමිෂන් සභාවට ඉදිරිපත් කර ස්ථිර කරන ලදී. ඒ අනුව ජූලි මස 01 දින සිට හිටපු අධ්‍යක්ෂකතුමාගේ සේවය වැටුප් රහිතව අත්හිටුවීමට සහ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණ ක්‍රියාත්මක කරන ලදී. මූලික විමර්ශන නිලධාරි විසින් සකස් කල එම චෝදනා පත්‍රය කොමිෂන් සභාවේ අනුමැතියෙන් අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරන ලදී. මේ හා අදාළ ඉදිරි විමර්ශන ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.4 මානව සම්පත් කළමනාකරණය

2.4.1 මුදල් අමාත්‍යාංශය මගින් 2019.11.20 දින අංක:DMS/Policy/Recruitments දරණ ලිපිය මගින් රාජ්‍ය ආයතනවල බදවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී. එනමුත් කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු කඩිනමින් සිදුකරගැනීම සඳහා ද්විතීය මට්ටමේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා විශේෂ අනුමැතියක් ලබා ගැනීමට කොමිෂන් සභාව විසින් 2020. 02.19 දින අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වා සිටි අතර අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාවට පිටපතක් සහිතව කළමනාකරණ සේවා

දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව අනුමැතිය සඳහා යොමු කර ඇත. තවද කොමිෂන් සභාව විසින් 2020.03.02 දින අංක NASTEC/CEO/admin/20/03/49L දරණ ලිපිය මගින් අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව ඉදිරියේ පිරවීමට නියමිත ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩුව පිළිබඳව ද ලිඛිතව දන්වන ලදී. එම පුරප්පාඩුව මාර්තු මස 26 වන දින සිදු වූ අතර පෙර සඳහන් ලිපියට අනුව එම බඳවා ගැනීම ද තාවකාලිකව අත්හිටුවා ඇත. තවද රටේ පැවති කොරෝනා වසංගත තත්වය මත ඒ වෙනුවෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් සිදු නොවූ අතර ඉදිරියේදී අවශ්‍ය බඳවා ගැනීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කිරීමට නියමිතයි.

2.4.2. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ 14 වන සටහනේ 10 වන පිටුවේ පුද්ගලික පඩි, නඩි යටතේ සේවක වැටුප්, දීමනා, සේවක අර්ථසාධක අරමුදලට ගෙවීම්, සේවක භාරකාර අරමුදලට ගෙවීම්, අතිකාල දීමනා ගෙවීම් හා කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ගෙවීම් ඇතුලත් වේ. කොමිෂන් සභාවේ 2019 වර්ෂයේ මුළු සේවක පිරිවැය පසු ගිය වර්ෂයට සාපේක්ෂව වර්ධනය වී ඇත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 මගින් සේවක වැටුප් වැඩි කර ඇති නිසාය.

2.5 කාර්යසාධනය

(අ) 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත අනුව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් විද්‍යා හා තාක්ෂණය (S&T) ආශ්‍රිත ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හා සංවර්ධනය කිරීමේ වැඩසටහන් සංවිධානය කර තිබිණි. 2019 වර්ෂයට අදාල, විද්‍යා හා තාක්ෂණ (S&T) නව ප්‍රතිපත්ති හදුනා ගැනීම හා ආරම්භ කිරීම සඳහා වූ වැඩපිළිවෙල 9 වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව හා සමගාමීව හදුනා ගැනීමට අදහස් කෙරිණි. එම 9 වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව 2019 මාර්තු මස පැවති 200 වන කොමිෂන් සභා රැස්වීම මගින් 2019 වර්ෂයේ නොපැවැත්වීමට තීරණය කරන ලදී. එම සමුළුව 2020 වර්ෂයේ දී පැවැත්වීමට තීරණය කරන ලදී. මේ සඳහා ආයතනයේ පැවති පරිපාලන ගැටලුව ද බලපාන ලදී. නව ප්‍රතිපත්ති හදුනා ගැනීම හා පිළියෙල කිරීම 2020 වර්ෂයේදී සෞභාගයේ දැක්ම ප්‍රත්පත්ති ප්‍රකාශයට අනුකූලව නිම කිරීමට අදහස් කරන අතර ඒ සඳහා මේ වන විටත් සාකච්ඡා කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

සැ .යු : STI යනු විද්‍යා , තාක්ෂණ සහ නවෝත්පාදන (Innovation) වේ.

(ආ) ජාතික විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන [Science, Technology and Innovation (STI)] ප්‍රතිපත්ති සංශෝධනය කිරීම 2018 වර්ෂයේදී කොමිෂන් සභාවේ අනුමැතිය අනුව ආරම්භ කල අතර, එම ප්‍රතිපත්ති 2019 වර්ෂයේදී නිම කිරීමට කටයුතු තීරණය කර තිබිණි. එහි කෙටුම්පත (Policy draft) සම්පූර්ණ කර අවසන් කර ඇති අතර එම ප්‍රතිපත්ති එලි දැක්වීම හා ප්‍රකාශනය කිරීම, 9 වන

ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව හා සමගාමීව නිම කිරීමට කටයුතු කර තිබූ නමුත් එම සමුළුව 2019 වර්ෂයේ පැවැත්වීම හා සංවිධානය නොකිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 200 වන කොමිෂන් සභා රැස්වීම මගින් තීරණය කෙරිණි. එම නිසා ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය 2019 වර්ෂයේදී එළි දැක්වීම සිදු නොවිණි. පවතින සෞඛ්‍ය තත්ත්ව යටතේ මෙම ද්වී වාර්ෂික සමුළුව මේ වසර අගදී පැවැත්වීමට බලාපොරොත්තු වන අතර, සෞභාග්‍ය දැක්මේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන මූලික කටයුතු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව යෝජිත ජාතික විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්තිය හෝ උපායමාර්ගික සැලසුම් ද සම්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) 2018 වර්ෂයට අදාල විද්‍යා හා තාක්ෂණ තත්වයන් (S&T Status) පිලිබඳව වාර්තාව සඳහා දත්ත එක්රැස් කිරීම 2019 වර්ෂයේ අගෝස්තු මාසයෙන් පසුව සිදු කරන ලද අතර, විද්‍යා හා තාක්ෂණ ආයතනය මගින් එම දත්ත ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් දත්ත එක්රැස් කිරීම, සම්පාදනය හා විශ්ලේෂණය කිරීම 2020 වර්ෂය දක්වා දීර්ඝ වුණි. දත්ත එක්රැස් කිරීම දැනට NSF හි තිබෙන සේවාදායක පරිගණකය (Server Computer) මගින් සිදු කරන අතර මෙම වසරේදී නස්ටෙක් ආයතනයට සේවාදායක පරිගණකයක් (Server Computer) ලබා ගැනීමට බලපොරොත්තු වේ. මෙමගින් මෙම දත්ත සමුදාය සංවර්ධනය කිරීම වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ඈ) (i) තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ (YSF) මෙහෙයුම් කමිටු (steering committee) රැස්වීම් 10 ක් 2019 වසරේ පැවැත්වීමට සැලසුම් කරගෙන සිටියද කමිටු සාමාජිකයන් සියල්ලෝම වෙනත් ආයතන/විශ්වවිද්‍යාල වල රැකියාවෙහි නියුතු විද්වතුන් සහ ආචාර්යවරුන් බැවින් ඔවුන්ගේ කාර්යබහුලත්වය හේතුවෙන් කමිටු රැස්වීම් 6 ක් පමණක් පැවැත්වීමට හැකි විය. එනමුත් මෙම තරුණ විද්‍යාඥයින්ගේ සංසදය වඩාත් ක්‍රියාකාරී ලෙස කටයුතු කරමින් බලාපොරොත්තු වූ දායකත්වය සපුරන ලදී.

(ඈ) (ii) තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ (YSF) ක්‍රියාකාරකම් ලෙස 2019 වර්ෂයේදී මූලික වශයෙන්; 8 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම, 2020 පැවැත්වීමට නියමිත 9 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ පෙර සුදානම් කටයුතු සිදු කිරීම, තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ මෙහෙයුම් කමිටු (steering committee) රැස්වීම් පැවැත්වීම, තරුණ විද්‍යාඥයින්ගේ හැකියා සංවර්ධනය සඳහා සංඛ්‍යාන වැඩමුළුවක් පැවැත්වීම යන කටයුතු සිදු කෙරුණු අතර අනෙකුත් ක්‍රියාකාරකම් වන සාධක බලකාය ඇතිකිරීම, දැනුම බෙදාහැරීම හා ප්‍රකාශයට පත් කිරීම, විද්‍යාත්මක ප්‍රජාව සවිබල ගැන්වීම සහ රදවා ගැනීම ආදියෙහි මූලික කටයුතු එම වසර තුල ආරම්භ කරන ලද අතර එමගින් 60% ක පමණ දායකත්වයක් ලබා දුනි. 20% ක දායකත්වය අදාළ වන්නේ YSF කාර්ය සාධක බලකාය සඳහා පමණි. YSF මෙම ආයතනයේ වඩාත් සක්‍රීයව ක්‍රියාකාරී සංසදයකි. ඉදිරි වසරයන්හි නව මුහුණුවරකින් තරුණ විද්‍යාඥයන් සඳහා විශාල වැඩ කොටසක් කිරීමට බලාපොරොත්තු වේ.

(ඉ) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ද්විවාර්ෂිකව පවත්වනු ලබන විද්‍යා හා තාක්ෂණය පිලිබඳ 9 වන ශ්‍රී ලංකා ද්විවාර්ෂික සමුළුව 2018 වර්ෂයේ නොවැම්බර් මස 8 සහ 9 වන දින එවකට සිටි අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වීමට නියමිතව තිබුණි. සමුළුවට අදාළ සියලුම ක්‍රියාකාරකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් ඒ වන විට සිදුකරමින් පැවතිනි. කෙසේ නමුත් ජනාධිපති ලේකම් තුමාගේ වාචික උපදෙස් පරිදි රටේ ඒ වන විට පැවති දේශපාලනික තත්ත්වය හේතු කොට ගෙන සමස්ත සමුළුව අවසාන මොහොතේ එනම් 2018 නොවැම්බර් 5 වන දින කල්දමන ලදී. එදින ආයතනයේ හිටපු සභාපතිතුමන්ගේ ප්‍රදානත්වයෙන් පැවති කාර්ය මණ්ඩල රැස්වීමේදී නිල වශයෙන් මේ පිලිබඳව ආයතනයේ කාර්ය මණ්ඩලය සහ සමුළුවේ වැඩකටයුතු සඳහා සම්බන්ධ වූ සියලු පාර්ශවයන්ට දැනුවත් කරන ලදී.

ඉන් පසුව 2018 දෙසැම්බර් මස 10 වන දින 199 වන කොමිෂන් සභා රැස්වීම සඳහා ඉහත සමුළුව තාවකාලිකම කල් දැමීම පිලිබඳව කොමිෂන් සභා පත්‍රිකාවක් ද (කොමිෂන් සභා පත්‍රිකා අංක: 199-05) ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාව විසින් ඉහත සමුළුව 2019 වර්ෂයේ මුල්භාගයේ පැවැත්වීමට තීරණය කරන ලදී.

ඒ වන විටත් ඉසව් කලමනාකරණයට අදාළ වැඩ කටයුතු සිදු කර අවසන් වී තිබුණු හෙයින් ඉහත සමුළුව තාවකාලිකව නතර කිරීම නිසා ඉසව් කළමනාකරුන් ඒ වන තෙක් සිදු කරන ලද වියදම් වෙනුවෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව අප ආයතනයේ අදාළ නිලධාරීන් විසින් ඉසව් කළමනාකරුන් සිදු කල කටයුතු සම්බන්ධයෙන් (Site inspection) වාර්තාවක් 2018. 12. 12 දින ආයතනයේ අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එම වර්ෂයේ දී සමුළුවේ වැඩ කටයුතු සඳහා නිම කරන ලද ආරාධනා පත්‍ර, ෆයිල් බෑග්, යකඩ තොරන් වැනි දෑ වෙනුවෙන් ඉසව් කළමනාකරුන්ට රු. 337,300 ක මුදලක් ගෙවන ලදී.

2018 දෙසැම්බර් මස තුළදී කොමිෂන් සභාව විසුරුවා හරින ලදී. 2019 මාර්තු මස 14 වන දින පැවැත්වූ 200 වෙනි කොමිෂන් සභාව මගින් සමුළුව 2020 වර්ෂය සඳහා නැවත කල් දමන ලදී. එවකට සිටි කොමිෂන් සභාව ගත් තීරණ අනුව නිලධාරීන්ට කටයුතු කිරීමට සිදු වුණි.

සැ. යු.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 2019 වර්ෂය තුලදී ජනවාරි, පෙබරවාරි, සහ දෙසැම්බර් මාසයන් තුළ කොමිෂන් සභාවකින් තොරව ආයතනය ක්‍රියාත්මක වූ අතර එම වසර තුළ කොමිෂන් සභා රැස්වීම් 7 ක් පමණක් පවත්වා ඇත. ආයතනයේ අභ්‍යන්තරයේ පැවති පරිපාලන ගැටලුව සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සහ මූලික විමර්ශනයක් සිදු විය. 2019 වසර තුල කොමිෂන්

සභාපතිවරුන් දෙදෙනෙක් යටතේ සහ වැඩ බලන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් යටතේ ආයතනයේ පරිපාලන කටයුතු සිදු වී ඇත.

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනි